## පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය.

### 1.1. හැඳින්වීම

1865 අංක 16 දරණ පොලිස් අඥා පනතට අනුව බ්‍රිතාන්‍ය පාලන සමයේදී මහජනතාවට සංවිධානාත්මක සේවාවක් ලබා දීමේ අරමුණින් පොලිස් දෙපාර්තමේන්තුව 1866 සැප්තැම්බර් මස 03 වන දින ආරම්භ කරන ලදි. එදා සිට මේ දක්වා වසර 154 කට අධික කාලයක් ශ්‍රී ලංකා පොලීසිය "රටේ නීතිය හා සාමය" සුරක්ෂිත කොට පවත්වාගෙන යාමේ භාරදූර වගකීම ඉටු කරමින් සිටී.

ජන ජීවිතයේ සෑම අංශයකම ආරක්ෂාව සහතික කරමින් සමාජ සුරක්ෂිත භාවය තහවුරු කිරීමේ පෘථුල වගකීම ශ්‍රී ලංකා පොලීසිය වෙත පැවරී ඇත. සමාජ සාමය සහ යහපැවැත්ම සඳහා පාදක වන අපරාධ මර්දනය හා නිවාරණය, මත් උවදුර මැඩලීම, දූෂණ මර්දනය, රථවාහන පාලනය, පරිසර ආරක්ෂණය, ආපදා අවස්ථාවන්හි ජනතාවට සහන සැලසීම සහ ප්‍රභූ ආරක්ෂාව යන ප්‍රධාන කාර්ය භාරයන් පොලීසියේ විෂය පථයට අදාල වේ.

ඉහත කාර්ය භාරයන් මුලු දිවයින පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා දවසේ පැය 24 පුරාම රාජකාරියෙහි නියැළෙන අධීක්ෂණ ශ්‍රේණිය, පරීක්ෂක ශ්‍රේණිය සහ කණිෂ්ඨ යන ශ්‍රේණීන්ගෙන් සැදුම්ලත් 88000 කට අධික පොලිස් නිලධරයන් සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටී. මෙම නිලධරයන් සාමාන්‍ය සේවය, සහායක සේවය සහ විශේෂ කාර්ය බලකාය ලෙස සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. මීට අමතරව 4000 කට අධික සිවිල් නිලධරයන් සංඛ්‍යාවක් ද ශ්‍රී ලංකා පොලිසියේ කාර්යයන් සඳහා සහාය දක්වමින් රාජකාරි කරනු ලබයි.

වසර 154 ක ඓතිහාසික මෙහෙවරක යෙදී සිටින ශ්‍රී ලංකා පොලීසිය අද වන විට වඩාත් පෘථුල කාර්ය භාරයක් ඉටු කිරීම සඳහා මහජනතාවට වඩාත් සමීප වෙමින් දිවයින පුරා පොලිස් ස්ථාන 494 ක් පිහිටුවා ඇත. ඊට අමතරව ප්‍රාදේශිය කොට්ඨාස 44 ක් සහ ක්‍රියාකාරී කොට්ඨාස 64 කින් සමන්විත සංවිධානාත්මක ආයතන ව්‍යුහයක් මගින් ශ්‍රී ලංකා පොලිසියේ සේවාවන් ක්‍රියාත්මක වේ.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර



### දැක්ම

අපරාධ සහ ප්‍රචණ්ඩත්වය
පිළිබඳව බියකින් තොරව
විශ්වාසයෙන් යුතුව
ජීවත් වීමට හැකි සාමකාමී
පරිසරයක් බිහි
කිරීම.


### මෙහෙවර

සැමට සමාන,
කිසිවකුටත් අගතියක්
සිදුකිරීමකින් තොරව
අපරාධ සහ
ත්‍රස්තවාදය
වැළැක්වීමටත්, සාමය
ආරක්ෂා කරගැනීමටත්,
දිවයිනේ නීතිය
පවත්වාගෙන යාමටත්,
එය ක්‍රියාත්මක කිරීමටත්
ශ්‍රී ලංකා පොලීසිය
විශ්වාසයෙන් යුතුව ක්‍රියා
කිරීමට ඇප කැප වී සිටියි.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- ❖ මහජන ආරක්ෂාව හා සාමය පවත්වාගෙන යාම
- ❖ අපරාධ පාලනය හා වැළැක්වීම
- ❖ අපරාධ විමර්ශනය හා නඩු මෙහෙයවීම
- ❖ මාර්ග ආරක්ෂාව හා රථවාහන පාලනය
- ❖ ප්‍රභූ ආරක්ෂාව
- ❖ පරිසර ආරක්ෂණ කටයුතු සහ ආපදා අවස්ථාවන්හි දී අදාළ අංශ වෙත සහාය ලබාදීම
- ❖ කැරළි හා දූෂණ මර්දන සහ විවිධ පැමිණිලි විසඳීම
- ❖ පොලිස් නිශ්කාෂණ හා පසුබිම් වාර්තා අදාළ අංශ සහ පුද්ගලයින් වෙත නිකුත් කිරීම.


## 1.4. සංවිධාන සටහන.





4

## 1.5. ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන අංශ


❖ ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ව්‍යුහය (ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ප්‍රමාණය 44 කි.)



❖ ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස ව්‍යුහය ( ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස ප්‍රමාණය 64 කි.)



❖ **විශේෂ කාර්ය බලකායේ ව්‍යුහය.**



## 1.6. අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව යටතේ පවතින ආයතනගත / අරමුදල්

| අනු අංකය | අරමුදලෙහි නම | 2020.12.31 දිනට ශේෂය |
|---|---|---|
| 01 | පොලිස් ත්‍යාග අරමුදල | 447,510,873.37 |
| 02 | පොලිස් අනුග්‍රහ අරමුදල | 123,005.42 |
| 03 | පොලිස් සුබවිහරණ අරමුදල | 42,151,780.03 |

මූලාශ්‍රය - ගණකාධිකාරී මුදල්

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු.

| | | |
|---|---|---|
| 1.1 | **01 වන ව්‍යාපෘතිය** | |
| | අ) ව්‍යාපෘතියේ නම | ටැබ් පරිගණක ලබා දීම (05 Nos Samsung Galaxy TAB S39 (Black) |
| | ආ) දායක නියෝජිතායතනය | :- චීන සමූහාණ්ඩුව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු.699,494.00 |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 1.2 | අ) ව්‍යාපෘතියේ නම | ලැප්ටොප් පරිගණක ලබා දීම (03 Nos Vostro 3580 C i7 Laptop) |
| | ආ) දායක නියෝජිතායතනය | :- චීන සමූහාණ්ඩුව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | රු.499,999.00 |
| | ඈ) වියාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 2.1 | **02 වන ව්‍යාපෘතිය** | |
| | අ) ව්‍යාපෘතියේ නම | ස්මාර්ට් දුරකථන ලබා දීම (35 Nos HUAWEI Y6s Smart Phone -Full Set with Box) |
| | ආ) දායක නියෝජිතායතනය | :- චීන සමූහාණ්ඩුව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |

| | | |
|---|---|---|
| 2.2 | අ) ව්‍යාපෘතියේ නම | ලැප්ටොප් පරිගණක ලබා දීම (30 Nos HUWAWEI nova 5T S mart Phone (Full Set With Box) |
| | | |
| | ආ) දායක නියෝජිතායතනය | :- චීන සමූහාණ්ඩුව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත |
| | ඇ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| | 03 වන ව්‍යාපෘතිය | |
| 3.1 | අ) ව්‍යාපෘතියේ නම | ඩෙක්ස්ටොප් පරිගණක (30 Nos Desktop Computer HP pro Desk) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඇ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 3.2 | අ) ව්‍යාපෘතියේ නම | පරිගණක මොනිටර් ලබා දීම (30 Nos Computer Monotor Dell 24 Inch) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර, වටිනාකම ලබා දී නොමැත |
| | ඇ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| | 04 වන ව්‍යාපෘතිය | |
| 4.1 | අ) ව්‍යාපෘතියේ නම | ප්‍රින්ටර් කළු සුදු (02 Nos Printer Black & White HP M 100) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඇ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 4.2 | අ) ව්‍යාපෘතියේ නම | ප්‍රින්ටර් කළු සුදු (03 Nos Printer Color HP MFPM 183fw) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත |
| | ඇ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| | | |
| 4.3 | අ) ව්‍යාපෘතියේ නම | ප්‍රින්ටර් කළු සුදු (30 Nos Microsoft Home Office) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |

| | | |
|---|---|---|
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| | <u>05 වන ව්‍යාපෘතිය</u> | |
| 5.1 | අ) ව්‍යාපෘතියේ නම | පරිගණක (06 Nos Desktop PC Dell 7060) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 5.2 | අ) ව්‍යාපෘතියේ නම | කොම්පියුටර් මොනිටර් (12 Nos Copmuter Monitor Dell 24 Inch) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| 5.3 | අ) ව්‍යාපෘතියේ නම | ලැප්ටොප් කොම්පියුටර් (03 Nos Laptop Computer HP 15) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| 5.4 | අ) ව්‍යාපෘතියේ නම | (01 Nos Computer Swich TP Link) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 5.5 | අ) ව්‍යාපෘතියේ නම | (01 Nos Q Nap Storage 16 TB 4x4 TB ) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 5.6 | අ) ව්‍යාපෘතියේ නම | (10 Nos Caballing Network) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |

| | | |
|---|---|---|
| 5.7 | අ) ව්‍යාපෘතියේ නම | (06 NosDigital Cameras Nikon Coolpix) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 5.8 | අ) ව්‍යාපෘතියේ නම | (06 Nos Mobile Telephone Samsung A30) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 5.9 | අ) ව්‍යාපෘතියේ නම | (06 Nos Hard Drive ITB -External) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 5.10 | අ) ව්‍යාපෘතියේ නම | (12 Nos HDMI Cable) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| 5.11 | අ) ව්‍යාපෘතියේ නම | (09 Nos Microsoft Home Office) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඕස්ට්‍රේලියාව |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | අයිතමයන් පමණක් ප්‍රදානය කර ඇති අතර,වටිනාකම ලබා දී නොමැත. |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |
| | 06 වන ව්‍යාපෘතිය | |
| 6.1 | අ) ව්‍යාපෘතියේ නම | සාර්ක් රටවල ත්‍රස්ත වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය (Terrorist offences Monitoring Desk - STOMD) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ඉංදියානු රජය |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2020වර්ෂය |
| | | |

| | | |
|---|---|---|
| | <u>07 වන ව්‍යාපෘතිය</u> | |
| 7.1 | අ) ව්‍යාපෘතියේ නම | රිය අනතුරු දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය සඳහා වූ Sri Lanka Accident Data Manegement System (SLADMS) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ලෝක සෞඛ්‍ය සංවිධානය - ශ්‍රී ලංකා නියෝජන කාර්යාලය |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | බස්නාහිර සහ මධ්‍යම පළාත සඳහා - රු.මිලියන 19.39 (ගෙවීම් කටයුතු කර ඇත) |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා |
| | | |
| 7.2 | අ) ව්‍යාපෘතියේ නම | රිය අනතුරු දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය සඳහා වූ Sri Lanka Accident Data Manegement System (SLADMS) |
| | ආ) දායක නියෝජිතායතනය | :- ලෝක සෞඛ්‍ය සංවිධානය - ශ්‍රී ලංකා නියෝජන කාර්යාලය |
| | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම | බස්නාහිර සහ මධ්‍යම පළාත හැර අනෙකුත් පළාත් 07 සඳහා - රු.මිලියන 48.78 |
| | ඈ) ව්‍යාපෘති කාල සීමාව | :- 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා |

මූලාශ්‍ර - පොලිස් සැපයුම් කොට්ඨාසය සහ රථවාහන පාලන හා මාර්ග ආරක්ෂණ කොට්ඨාසය

# පරිච්ඡේදය 02

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## <u>ප්‍රගතිය  - 2020</u>

## 2.1 බල අපරාධ

පහත වගුව මගින් 2020 වසරේ බල අපරාධ සම්බන්ධ ප්‍රගතිය 2018 සහ 2019 යන වසර වල බල අපරාධ වාර්තා වීම් සහ විසඳීම් සමගින් සන්සන්දනාත්මකව විග්‍රහ කර ඇත.

බල අපරාධ වගුව

| | ග්‍රහණ අපරාධ | 2018 | | | | 2019 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තාවූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තාවූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින |
| 1 | අපහරණය | **753** | **672** | **89%** | **81** | **663** | **566** | **85%** | **97** | **633** | **563** | **89%** | **70** |
| 2 | පැහැරගෙනයාම | **260** | **234** | **90%** | **26** | **212** | **190** | **90%** | **22** | **166** | **149** | **90%** | **17** |
| 3 | ගිනි තැබීම හෝ පුපුරණ ද්‍රව්‍යවලින් අනර්ථය සිදුකිරීම | **460** | **346** | **75%** | **114** | **510** | **477** | **94%** | **33** | **338** | **255** | **75%** | **83** |
| 4 | රු25000 ට වැඩි අලාභ ඇති වන පරිදි සිදු කෙරෙන අනර්ථය | **476** | **423** | **89%** | **53** | **525** | **448** | **85%** | **77** | **323** | **292** | **90%** | **31** |
| 5 | ගෙවල් බිඳීම | **8085** | **4868** | **60%** | **3217** | **8143** | **4472** | **55%** | **3671** | **6499** | **3791** | **58%** | **2708** |
| 6 | බරපතල තුවාල සිදුකිරීම | **942** | **912** | **97%** | **30** | **894** | **853** | **95%** | **41** | **892** | **872** | **98%** | **20** |
| 7 | අන්තරාදායක ආයුධවලින් (පිහි ආදිය) තුවාල කිරීම) | **1947** | **1855** | **95%** | **92** | **1857** | **1749** | **94%** | **108** | **1962** | **1891** | **96%** | **71** |
| 8 | මනුෂ්‍ය ඝාතනය | **489** | **442** | **90%** | **47** | **479** | **448** | **94%** | **31** | **464** | **438** | **94%** | **26** |
| 9 | මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීම / සියපණ හානිකර ගැනීමට අනුබලදීම | **144** | **132** | **92%** | **12** | **114** | **109** | **96%** | **5** | **103** | **102** | **99%** | **1** |
| 10 | ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට වැඩි) | **346** | **323** | **93%** | **23** | **289** | **264** | **91%** | **25** | **300** | **282** | **94%** | **18** |
| 11 | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) වින්දිතයාගේ කැමැත්ත ඇතිව | **1196** | **1162** | **97%** | **34** | **1185** | **1157** | **98%** | **28** | **1292** | **1262** | **98%** | **30** |
| | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) වින්දිතයාගේ කැමැත්ත නොමැතිව | **248** | **231** | **93%** | **17** | **305** | **284** | **93%** | **21** | **361** | **333** | **92%** | **28** |
| 12 | නීති විරෝධී රැස්වීම / කැරළි කෝලාහලය | **39** | **35** | **90%** | **4** | **84** | **84** | **100%** | **0** | **30** | **29** | **97%** | **1** |
| 13 | කොල්ලකෑම | **3146** | **2348** | **75%** | **798** | **2944** | **2019** | **69%** | **925** | **2148** | **1442** | **67%** | **706** |
| 14 | අස්වාභාවික වැරදි හා බරපතල ලිංගික අපයෝජනය | **750** | **711** | **95%** | **39** | **710** | **679** | **96%** | **31** | **677** | **661** | **98%** | **16** |
| 15 | බලෙන් ලබාගැනීම (යම් දේපලක් හෝ වටිනා ඇපයක් හෝ වටිනා ඇපයකට හැරවිය හැකිව අත්සන් කරනු ලැබූ හෝ මුද්‍රා තබනු ලැබූ යමක්) | **149** | **133** | **89%** | **16** | **106** | **96** | **91%** | **10** | **120** | **108** | **90%** | **12** |

| | ග්‍රහණ අපරාධ | 2018 | | | | 2019 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තාවූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තාවූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින |
| 16 | රුපියල් 300000/- කට (රුපියල් තුන් ලක්ෂයකට) වඩාවටිනාකමකින් යුතු සාපරාධි සාවද්‍ය පරිහරණය, සාපරාධි විශ්වාසය කඩකිරීම හා වංචා කිරීම | 6090 | 4123 | 68% | 1967 | 5251 | 3103 | 59% | 2148 | 2891 | 1506 | 52% | 1385 |
| 17 | රුපියල් 25000 ට වැඩි වටිනාකම ඇති වැව්ලි ද්‍රව්‍ය සොරකම | 48 | 41 | 85% | 7 | 46 | 43 | 93% | 3 | 59 | 51 | 86% | 8 |
| | රුපියල් 25000 ට වැඩි වටිනාකම ඇති ගව සොරකම | 777 | 611 | 79% | 166 | 585 | 445 | 76% | 140 | 524 | 415 | 79% | 109 |
| | රුපියල් 25000 ට වැඩි වටිනාකම ඇති දේපල සොරකම | 5171 | 3834 | 74% | 1337 | 4905 | 3379 | 69% | 1526 | 4073 | 2770 | 68% | 1303 |
| 18 | ව්‍යාජ මුදල් නෝට්ටු සන්තකය හා මුද්‍රණය | 74 | 72 | 97% | 2 | 89 | 87 | 98% | 2 | 68 | 64 | 94% | 4 |
| 19 | රාජ්‍ය විරෝධි අන්දමින් සිදු කෙරෙන වැරදි | 0 | 0 | 0% | 0 | 12 | 12 | 100% | 0 | 1 | 1 | 100% | 0 |
| 20 | ළමුන්ට කෲර ලෙස සැළකීම | 104 | 99 | 95% | 5 | 80 | 76 | 95% | 4 | 76 | 74 | 97% | 2 |
| 21 | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 50 | 48 | 96% | 2 | 34 | 32 | 94% | 2 | 26 | 25 | 96% | 1 |
| 22 | කූට්ටනය කිරීම හා තැනැත්තන් වෙළදාම් කිරීම | 23 | 15 | 65% | 8 | 9 | 6 | 67% | 3 | 28 | 16 | 57% | 12 |
| 23 | පීඩාකාරි ආයුධ ආඥා පනත යටතේ ගැනෙන වැරදි | 74 | 70 | 95% | 4 | 86 | 83 | 97% | 3 | 110 | 109 | 99% | 1 |
| 24 | ස්වයංක්‍රිය ගිනි අවි හෝ රිපීටර් තුවක්කු ලඟ තබාගැනීම | 24 | 24 | 100% | 0 | 27 | 27 | 100% | 0 | 34 | 34 | 100% | 0 |
| 25 | හෙරොයින්, කොකේන්, මෝෆීන් කිසියම්ම ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම, වෙළදාම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හෝ හෙරොයින් ග්‍රෑම් 2 ක් හෝ ඊට වැඩි කොකේන් ග්‍රෑම් 02 ක් හෝ ඊට වැඩි මෝෆීන් ග්‍රෑම් 03 ක් හෝ ඊට වැඩි ඔපියම් ග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි ගංජා කි.ග්‍රෑම් 5 ක් හෝ ඊට වැඩි හා හෂීස් කි.ග්‍රෑම් 1 ක ප්‍රමාණයක් වූ අන්තරාදායක මත්ද්‍රව්‍ය ලඟතබා ගැනීම | 4387 | 4382 | 100% | 5 | 4340 | 4331 | 100% | 9 | 6811 | 6789 | 100% | 21 |
| 26 | පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධාකිරීම | 102 | 100 | 98% | 2 | 94 | 92 | 98% | 2 | 89 | 88 | 99% | 1 |
| | එකතුව | 36354 | 28246 | 78% | 8108 | 34578 | 25611 | 74% | 8967 | 31098 | 24412 | 79% | 6685 |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

වගුවට අනුව 2018 සහ 2019 වසර වලට සාපේක්ෂව 2020 වසරේ අපහරණය වැරදි වල අඩුවීමක් දක්නට ලැබේ. 2019 වසරට සාපේක්ෂව අපහරණය වැරදි 663 සිට 633 දක්වා 4% කින් 2020 වසරේ පහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2019 වසරේ 85% සිට 2020 වසරේ 89% දක්වා ඉහළ ගොස් ඇත.

පැහැර ගැනීම් අපරාධ 166 ක් 2020 වසරේ වාර්තා වි ඇති අතර එය 2019 වසරේ වාර්තා වු පැහැර ගැනිම් 212 ට සාපේක්ෂව 21% ක අඩු විමකි. 2020 වසරේ පැහැර ගැනිම් අපරාධ වල විසඳිමේ ප්‍රතිශතය 90% ක් ලෙස පෙන්නුම් කර ඇත.

2020 වසරේ ගෙවල් බිඳුම් අපරාධ සැළකිල්ලට ලක් කිරිමේ දි 2019 වසරේ වාර්තා වු සිදුවීම් 8143 ට සාපේක්ෂව 2020 වසරේ ගෙවල් බිඳුම් 6499 ක් දක්වා 20% කින් පහළ ගොස් ඇත. විසඳිම් ප්‍රතිශතය විමසිමේ දි 55% ක් වු 2019 වසරේ විසඳීමේ ප්‍රතිශතය 2020 වසරේ 58% ක් දක්වා ඉහළ ගොස් ඇත.

වගුවට අනුව 2020 වසරේ මනුෂ්‍යා ඝාතන පිළිබඳ විමසිමේ දි 3%ක අඩු විමක් 2019 වසරට සාපේක්ෂව හඳුනා ගත හැකිය. ඒ අනුව 2019 වසරේ මනුෂ්‍යා ඝාතන අපරාධ 479 ක් වාර්තා වු අතර 2020 වසරේ එය 464 දක්වා 3% කින් අඩු වි ඇත.

මනුෂ්‍යා ඝාතන අපරාධ වල විසඳීම් ප්‍රතිශතය 2019 වසරේ 93% ක් වු අතර 2020 වසරේ 94% ක් දක්වා වර්ධනය වි ඇත.

වගුවට අනුව ස්ත්‍රී දූෂණ අපරාධ සැළකිල්ලට ලක් කිරීමේ දි කොටස් තුනකට බෙදා වර්ගීකරණය කර දත්ත ඉදිරිපත් කර ඇත. ඒ අනුව වයස 16 ට වැඩි ස්ත්‍රීන් දූෂණය කිරීමේ අපරාධ විමසා බැලීමේ දී 2019 වසරට වඩා 4% ක ඉහළ යාමක් 2020 වසරේ හඳුනා ගත හැකිය. 2019 වසරේ මෙම අපරාධ 289 ක් වාර්තා වු අතර 2020 වසරේ වාර්තා වු ප්‍රමාණය 300 ක් ලෙස දැක්වේ. විසඳිමේ ප්‍රතිශතය ගත් විට 2019 වසරේ වයස 16 ට වැඩි ස්ත්‍රීන් දූෂණය කිරිමේ අපරාධ වල විසඳීම් ප්‍රතිශතය 91% ක් වු අතර 2020 වසරේ විසඳීමේ ප්‍රතිශතය 94% ක් දක්වා ඉහළ ගොස් ඇත.

වින්දිතයාගේ කැමැත්ත සහිතව සිදු කරන ලද වයස අවුරුදු 16 ට අඩු ස්ත්‍රී දූෂණ අපරාධ එනම් ස්ත්‍රී දූෂණ අපරාධ වල වැඩිපුරම වාර්තා වන අපරාධ පිළිබඳ සැළකිමේ දි 2019 වසරේ එබඳු අපරාධ 1185 ක් වාර්තා වි ඇති අතර ඊට සාපේක්ෂව 2020 වසරේ එම අපරාධ ප්‍රමාණය 1292ක් දක්වා 9% කින් ඉහළ ගොස් ඇත. මෙම අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 2020 වසරේ 97% කි.

ස්ත්‍රී දූෂණ අපරාධ වල වයස 16 ට අඩු වින්දිතයාගේ කැමැත්ත නොමැතිව සිදු කරන ලද අපරාධ 2019 වසරේ 305 ක් වාර්තා වි ඇති අතර එය 2020 වසරේ 361 ක් දක්වා 18% කින් ඉහළ ගොස් ඇත. මෙම අපරාධ වල 2020 වසරේ විසඳීමේ ප්‍රතිශතය 92% කි. දත්ත විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන කරුණක් වන්නේ ඉහත වර්ග තුනටම අයත් ස්ත්‍රී දූෂණ අපරාධ 2019 වසර හා සැසඳීමේ දී 2020 වසරේ තරමක් ඉහළ ගොස් ඇති බවයි.

වගුවට අනුව බල අපරාධ වල ඉතා බහුල ලෙස වාර්තා වන අපරාධයක් ලෙස කොල්ලකෑම් හඳුනා ගත හැකිය. කෙසේ වුවද 2019 වසරට සාපේක්ෂව මෙම අපරාධවල පහළ යාමක් 2020 වසරේ හඳුනා ගත හැකිය. ඒ අනුව 2019 වසරේ කොල්ලකෑම් 2944 ක් වාර්තා වී ඇති අතර

2020 වසරේ 2148 ක් දක්වා 27% කින් පහළ ගොස් ඇත. කොල්ලකෑම් වල විසඳීමේ ප්‍රතිශතය 2020 වසරේ 67% ක් ලෙස දැක්වේ.

බරපතල ලිංගික අපයෝජනය යටතට ගැනෙන අපරාධ 710 ක් 2019 වසරේ වාර්තා වි ඇති අතර ඊට සාපේක්ෂව 2020 වසරේ එම අපරාධ 677 ක් දක්වා 5% කින් පහත වැටි ඇත. මෙම අපරාධ වල 2020 වසරේ විසඳීමේ ප්‍රතිශතය 98% කි.

වගුවට අනුව රුපියල් ලක්ෂ තුනට වැඩි සාපරාධි සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම යටතේ ගැනෙන අපරාධ සැලකිය යුතු ප්‍රමාණයක් පොලිසීය වෙත වාර්තා වේ.2020 වසරේ මෙබඳු අපරාධ 2891 ක් වාර්තා වු අතර එය 2019 වසරේ වාර්තා වු 5251 ට සාපේක්ෂව 45 % ක් වැනි සැළකිය යුතු මට්ටමේ පහළ යාමක් ලෙස හඳුනා ගත හැකිය. මෙම අපරාධ වල 2019 වසරේ විසඳීමේ ප්‍රතිශතය 59% ක් වු අතර 2020 වසරේ විසඳීමේ ප්‍රතිශතය 52% කි.

වගුවේ දත්ත වලට අනුව රු. 25000/- ට වැඩි දේපළ සොරකම් අපරාධ 4905 ක් 2019 වසරේ සිදුව ඇති අතර එය 4073 ක් දක්වා 2020 වසරේ 17% කින් පහළ ගොස් ඇත. මෙම අපරාධවල විසඳීමේ ප්‍රතිශතය 2020 වසරේ 68% ක් ලෙස දක්වා ඇත.

මත්ද්‍රව්‍ය අපරාධ සම්බන්ධයෙන් වගුවට අනුව කරුණු සලකා බැලිමේ දි 2019 වසරට සාපේක්ෂව2020 වසරේ මත්ද්‍රව්‍ය අපරාධ වල ඉතා සැලකිය යුතු ඉහළ යාමක් හඳුනාගත හැකිය. ඒ අනුව 2019 වසරේ මත්ද්‍රව්‍ය අපරාධ 4340 ක් වාර්තා වි ඇති අතර 2020 වසරේ එය 6811 ක් දක්වා 57% ක ඉහළ යාමක් දක්නට ඇත. කෙසේ වුවද වසර දෙකෙහිම මත්ද්‍රව්‍ය අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 99% මට්ටම ඉක්මවා ඇත.

### 2.1.1 කාන්තාවන්ට එරෙහි බල අපරාධ

පහත වගුව මගින් කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තාවීම් පසුගිය වසර තුනකට අදාලව සන්සන්දනාත්මකව දක්වා ඇත. එමගින් 2018 සහ 2019 වසර දෙකට සාපේක්ෂව 2020 වසරේ කාන්තාවන්ට එරෙහි අපරාධ වාර්තා වීමේ සහ එම අපරාධ විසඳීමේ ප්‍රගතිය හඳුනාගත හැක.

**කාන්තාවන්ට එරෙහි සිදුකරනු ලබන බල අපරාධ වගුව**

| | වරද | 2018 | | | | 2019 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින |
| 1 | මිනීමැරීම | 111 | 53 | 48% | 58 | 95 | 43 | 45% | 52 | 82 | 25 | 30% | 57 |
| 2 | සියපණ හානිකර | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 3 | 2 | 67% | 1 |
| 3 | මිනීමැරීමට තැත්කිරීම | 11 | 2 | 18% | 9 | 6 | 2 | 33% | 4 | 10 | 2 | 20% | 8 |
| 4 | ස්ත්‍රී දූෂණය | 274 | 135 | 49% | 139 | 199 | 62 | 31% | 137 | 237 | 98 | 41% | 139 |
| 5 | ව්‍යභිචාරය | 4 | 2 | 50% | 2 | 4 | 1 | 25% | 3 | 7 | 0 | 0% | 7 |
| 6 | බරපතල තුවාල | 241 | 97 | 40% | 144 | 208 | 77 | 37% | 131 | 174 | 64 | 37% | 110 |
| 7 | පිහි ආදියෙන් තුවාල සිදුකිරීම | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 |
| 8 | අස්වාභාවික වැරදි | 5 | 0 | 0% | 5 | 1 | 0 | 0% | 1 | 4 | 2 | 50% | 2 |

| වරද | | 2018 | | | | 2019 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තා වූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින |
| 9 | බරපතල ලිංගික | 28 | 12 | 43% | 16 | 35 | 19 | 54% | 16 | 15 | 5 | 33% | 10 |
| 10 | අපහරණය | 7 | 1 | 14% | 6 | 1 | 1 | 100% | 0 | 1 | 0 | 0% | 1 |
| 11 | පැහැරගෙනයාම | 68 | 30 | 44% | 38 | 44 | 27 | 61% | 17 | 38 | 13 | 34% | 25 |
| 12 | කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රීන් සැපයීම | 2 | 0 | 0% | 2 | 7 | 0 | 0% | 7 | 6 | 3 | 50% | 3 |
| 13 | කාමුක සංසර්ගය සඳහා වෙළඳාම | 0 | 0 | 0% | 0 | 2 | 1 | 50% | 1 | 0 | 0 | 0% | 0 |
| 14 | තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | 0 | 0 | 0% | 0 | 1 | 0 | 0% | 1 | 1 | 0 | 0% | 1 |
| 15 | වෙනත් | 24 | 11 | 46% | 13 | 35 | 15 | 43% | 20 | 17 | 5 | 29% | 12 |
| එකතුව | | 775 | 343 | 44% | 432 | 638 | 248 | 39% | 390 | 595 | 219 | 37% | 376 |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

වගුවට අනුව සමාජයේ අවධානයට පාත්‍රවන අපරාධ පිළිබඳ සලකා බැලීමේදී කාන්තාවන්ට එරෙහි මනුෂ්‍ය ඝාතනවල ක්‍රමාණුකූල අඩුවීමක් හඳුනාගත හැකිය. විශේෂයෙන්ම 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ මෙම මනුෂ්‍ය ඝාතන 95 සිට 82 ක් දක්වා 14% කින් පහළ ගොස් ඇත. කෙසේ වුවද 2019 ට සාපේක්ෂව විසඳීමේ ප්‍රතිශතය 45% සිට 30 % දක්වා අඩුවීමක් දැකිය හැකිය.

කාන්තාවන්ට එරෙහි බිහිසුණු අපරාධයක් වන ස්ත්‍රී දූෂණ අපරාධ වල ඉහළ යාමක් 2020 වසරේ හඳුනා ගත හැකිය. එනම් 2019 වසරේ වාර්තා වූ අපරාධ 199 ට සාපේක්ෂව 2020 වසරේ අපරාධ 237 ක් දක්වා 19% කින් ඉහල ගොස් ඇත. වගුවට අනුව ස්ත්‍රී දූෂණ අපරාධ වල 2019 වසරේ විසඳීමේ ප්‍රතිශතය 31% ක් වූ අතර 2020 වසරේ විසඳීමේ ප්‍රතිශතය 41% ක් දක්වා වර්ධනය වී ඇත.

වගුවට අනුව බරපතල තුවාල සිදුකිරීම් අපරාධ වලද ක්‍රමාණුකූල පහළයාමක් පසුගිය වසර තුළ හඳුනාගත හැකිය ඒ අනුව 2019 වසරේ 208 ක් වූ කාන්තාවන්ට එරෙහි බරපතල තුවාල සිදුකිරිමේ අපරාධ 2020 වසරේ 174 ක් දක්වා 16 % කින් පහළ ගොස් ඇත. මෙම අපරාධවල විසඳීමේ ප්‍රතිශතය 2019 සහ 2020 වසරවල 37 % කි.

බරපතල ලිංගික අපයෝජනය වරද ගත්විට, කාන්තාවන්ට එරෙහි මෙබඳු අපරාධ 35 ක් 2019 වසරේ වාර්තා වී ඇති අතර 2020 වසරේ එය 15 ක් දක්වා 57% කින් පහළ ගොස් ඇත. කෙසේ උවද විසඳීමේ ප්‍රතිශතය 2019 වසරේ 54% සිට 2020 වසරේ 33%ක් දක්වා අඩුවීමක් දැකිය හැකිය.

වගුවට අනුව කාන්තාවන්ට එරෙහි පැහැරගෙන යාම් අපරාධ ගත්විට 2018 -2020 වසර තුන තුළ පහළයාමක් දැකිය හැකිය. 2020 වසරේ වාර්තා වී ඇති අපරාධ ප්‍රමාණය 38 ක් වන අතර එය 2019 වසරේ වාර්තා වූ අපරාධ 44 ට සාපේක්ෂව 14% ක පහළයාමකි. මෙම අපරාධවල විසඳීමේ ප්‍රතිශතය 2019 වසරේ 61% ක් වූ අතර 2020 වසරේ 34% ක් දක්වා පහත වැටීමක් සිදුව ඇත.

## 2.1.2 ළමයින්ට එරෙහි බලඅපරාධ

ළමයින්ට එරෙහි බලඅපරාධ ඛාණ්ඩ 15 ක් යටතේ පහත වගුව මගින් දක්වා ඇත. එමගින් පසුගිය 2018, 2019, 2020 වසර තුනට අදාලව එම අපරාධ වාර්තා විම් සහ විසඳීම් වල ප්‍රගතිය සන්සන්දනාත්මක ව හඳුනාගත හැකිය.

**ළමයින්ට එරෙහි සිදුකරනු ලබන බල අපරාධ වගුව**

| | වරද | | 2018 | | | | 2019 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්තාවූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තාවූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින | වාර්තාවූ | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | විමර්ශනය වෙමින් පවතින |
| 1 | මිනී මැරුම | | 19 | 12 | 63% | 7 | 26 | 7 | 27% | 19 | 22 | 6 | 27% | 16 |
| 2 | සියපණ හානිකරගැනීමට අනුබල දීම | | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 |
| 3 | මිනී මැරීමට තැත්කිරීම | | 4 | 0 | 0% | 4 | 5 | 2 | 40% | 3 | 9 | 0 | 0% | 9 |
| 4 | ස්ත්‍රී දූෂණය | වයස අවු 16 ට අඩු කැමැත්ත ඇතිව | 1199 | 644 | 54% | 555 | 1185 | 488 | 41% | 697 | 1292 | 493 | 38% | 799 |
| | | වයස අවු 16 ට අඩු කැමැත්ත නොමැතිව | 248 | 114 | 46% | 134 | 285 | 129 | 45% | 156 | 315 | 74 | 23% | 241 |
| | | වයස අවු 16 - 18 අතර | 71 | 37 | 52% | 34 | 72 | 26 | 36% | 46 | 51 | 13 | 25% | 38 |
| | | ව්‍යභිචාරය | 24 | 11 | 46% | 13 | 34 | 12 | 35% | 22 | 50 | 22 | 44% | 28 |
| 5 | බරපතල තුවාල සිදුකිරීම | | 54 | 21 | 39% | 33 | 36 | 17 | 47% | 19 | 32 | 5 | 16% | 27 |
| 6 | පිහි ආදියෙන් තුවාල සිදු කිරීම | | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 |
| 6 | අස්වාභාවික වැරදි | | 35 | 3 | 9% | 32 | 42 | 11 | 26% | 31 | 7 | 5 | 71% | 2 |
| 7 | බරපතල ලිංගික අපයෝජනය | | 688 | 408 | 59% | 280 | 623 | 306 | 49% | 317 | 615 | 267 | 43% | 348 |
| 8 | අපහරණය | | 782 | 436 | 56% | 346 | 606 | 263 | 43% | 343 | 632 | 233 | 37% | 399 |
| 9 | පැහැරගෙනයාම | | 67 | 20 | 30% | 47 | 25 | 12 | 48% | 13 | 17 | 1 | 6% | 16 |
| 10 | කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රී සැපයීම | | 8 | 5 | 63% | 3 | 2 | 1 | 50% | 1 | 2 | 0 | 0% | 2 |
| 11 | තැනැත්තන් වෙළඳාම | | 2 | 0 | 0% | 2 | 0 | 0 | 0% | 0 | 8 | 1 | 13% | 7 |
| 12 | ළමයින්ට කෲර ලෙස සැළකීම | | 104 | 46 | 44% | 58 | 80 | 38 | 48% | 42 | 76 | 33 | 43% | 43 |
| 13 | අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | | 49 | 30 | 61% | 19 | 34 | 10 | 29% | 24 | 27 | 4 | 15% | 23 |
| 14 | පුද්ගලයින් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | | 2 | 0 | 0% | 2 | 5 | 0 | 0% | 5 | 3 | 0 | 0% | 3 |
| 15 | වෙනත් | | 6 | 2 | 33% | 4 | 5 | 1 | 20% | 4 | 4 | 2 | 50% | 2 |
| | එකතුව | | 3362 | 1789 | 53% | 1573 | 3065 | 1323 | 43% | 1742 | 3162 | 1159 | 37% | 2003 |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

වගුවෙහි ඇතුළත් දත්ත විශ්ලේෂණාත්මකව විමසා බැලීමේදි පෙනී යන්නේ 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ ළමයින්ට එරෙහි මනුෂ්‍ය ඝාතන අපරාධවල පහළ යාමක් සිදුව ඇති බවයි. ඒ අනුව 2019 වසරේ වාර්තා වූ මෙබඳු අපරාධ 26 ට සාපේක්ෂව 2020 වසරේ අපරාධ 22 ක් දක්වා 15% කින් පහළ ගොස් ඇත. මෙම අපරාධවල විසඳීමේ ප්‍රතිශතය වසර දෙකෙහිම 27 % කි.

ළමයින්ට එරෙහි අපරාධ අතර ඉතා බරපතල අපරාධ ඛාණ්ඩයක් වන ස්ත්‍රී දූෂණ අපරාධ කොටස් තුනකට වර්ගකොට වගුව මගින් දක්වා ඇත.

එනම් වයස අවුරුදු 16 ට අඩු වින්දිතයින්ගේ කැමැත්ත සහිත ස්ත්‍රී දූෂණ, 16 ට අඩු වින්දිතයින්ගේ කැමැත්ත රහිත ස්ත්‍රී දූෂණ හා වයස අවුරුදු 16 -18 ත් අතර ස්ත්‍රී දූෂණ වේ.

වගුවට අනුව ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ අතරින් වයස 16 ට අඩු වින්දිතයින්ගේ කැමැත්ත සහිත ස්ත්‍රී දූෂණ බහුල ලෙස වාර්තා වී ඇත. 2019 වසරෙහි මෙම අපරාධ 1185 ක් වාර්තා වී ඇති අතර එම සංඛ්‍යාවෙහි 9% ක වර්ධනයක් පෙන්නුම්කරමින් 2020 වසරේ ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ 1292 ක් වාර්තා වී ඇත.

වින්දිතයාගේ කැමැත්ත රහිතව වයස අවුරුදු 16 ට අඩු ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ සැලකිය යුතු සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර වගුවට අනුව එම අපරාධවලද ක්‍රමානුකූල වර්ධනයක් දැකිය හැකිය. ඒ අනුව 2019 වසරේ මෙබඳු අපරාධ 285 ක් වාර්තා වී ඇති අතර 2020 වසරේ එම ප්‍රමාණය 315 ක් දක්වා 10% කින් ඉහල ගොස් ඇත.

වයස අවුරුදු 16-18 ත් අතර ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ සලකා බැලීමේ දී පෙනී යන්නේ මෙම ස්ත්‍රී දූෂණ පෙර සඳහන් කළ වර්ග දෙකට වඩා අඩුවෙන් වාර්තා වී ඇති බවයි. එමෙන්ම මෙම අපරාධවල යම් අඩුවීමක් ද 2020 වසරේ දැකිය හැකි අතර 2019 වසරේ වාර්තා වූ අපරාධ 72 ට සාපේක්ෂව 2020 වසරේ අපරාධ 51 දක්වා 29% කින් පහළ ගොස් ඇත.

ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය සැලකීමේ දී 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ සැළකිය යුතු පහළ යාමක් වගුව අනුව හඳුනාගත හැකිය. ළමයින්ට එරෙහි බරපතල තුවාල සිදුකිරීමේ අපරාධ ගත් විට වගුවෙහි සඳහන් වසර තුනට අදාලව පහළ යාමක් දක්නට ලැබේ. 2019 වසරෙහි අපරාධ 36 ක් වාර්තා වූ අතර 2020 වසරේ එම ප්‍රමාණය 32 ක් දක්වා 11% කින් පහළ ගොස් ඇත. මෙම වරදෙහි විසඳීමේ ප්‍රතිශතය 2020 වසරෙහි 16% ක් තරම් අඩු අගයක් පෙන්නුම් කරයි.

බරපතල ලිංගික අපයෝජනය ගත්විට, ළමයින්ට එරෙහි මෙම අපරාධවල සුළු අඩුවීමක් පසුගිය වසර තුන තුළ හඳුනා ගත හැකිය. 2019 වසරේ මෙම අපරාධ 623 ක් වාර්තා වී ඇති අතර එය 2020 වසරේ 615 ක් දක්වා 1% කින් අඩු වී ඇත.

ළමයින්ට එරෙහි බරපතල අපරාධ යටතට ගැනෙන අපහරණය නැමැති වැරදි 632 ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර එය 2019 වසරේ වාර්තා වූ එම අපරාධ 606 ට සාපේක්ෂව 04% ක ඉහළ යාමකි. එමෙන්ම වගුව අනුව පැහැර ගැනීම් අපරාධ 17 ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර එය 2019 වසරේ වාර්තා වූ අපරාධ 25 ට සාපේක්ෂව 32% ක පහළ යාමකි.

අපහරණය නැමැති අපරාධවල 2020 වසරේ විසඳීම් ප්‍රතිශතය 37% ක් වූ අතර පැහැර ගැනීම් අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 2020 වසරේ 06% ක් වැනි අඩු මට්ටමක පවතී.

ළමයින්ට කෲර ලෙස සැළකීමේ සිදුවීම් මෑත කාලීනව සැළකිය යුතු මට්ටමකින් වාර්තා වනු දැකිය හැකි උවද ඉහත වගුව අනුව පසුගිය වසර තුන තුළ මෙම අපරාධ වල පහළ යාමක් දැකිය හැකිය. 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ මෙම වැරදිවල සැලකිය යුතු අඩුවීමක් හඳුනාගත හැකි අතර 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ 5% ක අඩුවීමක් දැකිය හැකිය. ළමයින්ට එරෙහි කෲරත්වය අපරාධවල විසඳීම් ප්‍රතිශතය 2020 වසරේ 43% කි.

## 2.2 මත්ද්‍රව්‍ය අපරාධ

බල අපරාධ යටතට ද ගැනෙන මෙම මත්ද්‍රව්‍ය අපරාධ සම්බන්ධ දත්ත වෙනම භාණ්ඩයක් ලෙසද වර්ගීකරණය කෙරේ. ඒ අනුව වර්ග 7 ක් යටතේ පහත වගුව මගින් දත්ත ඉදිරිපත් කර ඇති අතර වසරක් තුළ මෙම අපරාධ වාර්තා විම ඉතා ඉහළ අගයක පවතින බව වගුව ආශ්‍රයෙන් හඳුනාගත හැකිය.

**නිද්‍රා ජනක ද්‍රව්‍ය**

| | වර්ගය | 2018 | | | | | | | 2019 | | | | | | | 2020 | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | නඩු පවරන ලද | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | | | වාර්තා වූ | නඩු පවරන ලද | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | | | වාර්තා වූ | නඩු පවරන ලද | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | | |
| | | | | | | කි.ග්‍රෑ | ග්‍රෑ | මි.ග්‍රෑ | | | | | කි.ග්‍රෑ | ග්‍රෑ | මි.ග්‍රෑ | | | | | කි.ග්‍රෑ | ග්‍රෑ | මි.ග්‍රෑ |
| 1 | ගංජා | 71505 | 69886 | 63603 | 98% | 8884 | 457 | 162 | 63585 | 62024 | 56231 | 98% | 15389 | 235 | 934 | 56486 | 54484 | 48847 | 96% | 6791 | 694 | 308 |
| 2 | අබිං | 3 | 1 | 1 | 33% | 0 | 8 | 380 | 169 | 141 | 147 | 83% | 9 | 589 | 198 | 138 | 133 | 134 | 96% | 0 | 975 | 245 |
| 3 | හෂීස් | 199 | 189 | 161 | 95% | 82 | 291 | 597 | 603 | 597 | 536 | 99% | 10 | 164 | 637 | 55 | 51 | 42 | 93% | 0 | 193 | 149 |
| 4 | හෙරොයින් | 47355 | 44346 | 36356 | 94% | 721 | 363 | 175 | 56482 | 52553 | 44983 | 93% | 2101 | 691 | 246 | 66331 | 61473 | 43124 | 93% | 574 | 445 | 15 |
| 5 | මෝෆින් | 254 | 187 | 165 | 74% | 0 | 194 | 784 | 18 | 18 | 18 | 100% | 0 | 1 | 950 | 5 | 5 | 5 | 100% | 0 | 1 | 95 |
| 6 | කොකේන් | 74 | 62 | 45 | 84% | 9 | 859 | 780 | 133 | 122 | 119 | 92% | 24 | 725 | 653 | 49 | 46 | 31 | 94% | 1 | 250 | 691 |
| 7 | වෙනත් | 5550 | 5381 | 4770 | 97% | 556 | 389 | 26 | 8775 | 8711 | 7907 | 99% | 480 | 845 | 576 | 11118 | 6475 | 9430 | 58% | 1046 | 419 | 774 |
| | එකතුව | 124940 | 120052 | 105101 | 96% | 10254 | 563 | 904 | 129765 | 124166 | 109941 | 96% | 18016 | 254 | 194 | 134182 | 122667 | 101613 | 91% | 8414 | 2979 | 277 |

**මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය**

වගුව අනුව 2019 වසරට සාපේක්ෂව 2020 වසර තුළ හෙරෝයින් සහ "වෙනත්" භාණ්ඩය යටතට ගැනෙන මත්ද්‍රව්‍ය වැරදි හැර අනෙකුත් සියළුම වැරදිවල සැලකිය යුතු අඩුවිමක් දක්නට ඇත.

මෙම මත්ද්‍රව්‍ය වැරදිවල බහුලව වාර්තා වන වර්ගය වන ගංජා මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි 63585 ක් 2019 වසරේ වාර්තා වි ඇති අතර 2020 වසර තුළ එම ප්‍රමාණය 56486 ක් දක්වා 11% කින් පහත වැටි ඇත. වාර්තා වූ වැරදි සංඛ්‍යාවෙන් 96% ක් එනම් 54484 ක් සඳහා නඩු පවරා ඇති අතර වරදකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව 48847 කි.

අබිං සම්බන්ධ වැරදි වාර්තා වීම්, වගුවෙහි දැක්වෙන වසර තුනට අදාලව සලකා බැලීමේදී 2018 වසරට සාපේක්ෂව 2019 වසරෙහි මෙම වැරදි ඉතා විශාල ලෙස ඉහළයාමක් දැකිය හැකිය. කෙසේ වෙතත් 2020 වසරෙහි අබිං සම්බන්ධ වැරදි 169 සිට 138 දක්වා 18% කින් පහළ ගොස් ඇත. නඩු පැවරිමේ ප්‍රතිශතය 2020 වසරෙහි 96% ක් වන අතර පුද්ගලයින් 134 දෙනෙකු වරදකරුවන් බවට පත්කොට ඇත.

හෂීෂ් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි ගත් විට 2019 වසරෙහි වාර්තා වූ වැරදි 603 ට සාපේක්ෂව 2020 වසරෙහි වැරදි 55 ක් දක්වා 91% ක ඉතා විශාල අඩුවීමක් හඳුනාගත හැකිය. නඩු පැවරිමේ ප්‍රතිශතය 93 % ක් වන අතර පුද්ගලයින් 42 දෙනෙකු වරදකරුවන් බවට පත්කර ඇත.

මත්ද්‍රව්‍ය අපරාධවල ඉතා ඉහළ අගයක් ගනු ලබන මෙන්ම ක්‍රමික වර්ධනයක් ද පෙන්නුම් කරනු ලබන මත්ද්‍රව්‍යයක් වන හෙරෝයින් සම්බන්ධ වැරදි සලකා බැලීමේදී 2019 වසරේ වැරදි 56482 ක් වාර්තා වි ඇති අතර 2020 වසරේ එම ප්‍රමාණය 66331 ක් දක්වා 17% කින්

වර්ධනය වී ඇත. 2020 වසරේ හෙරොයින් වැරදි සඳහා නඩු පැවරීම් ප්‍රතිශතය 92 % කි. වරදකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව 43124 කි.

අත්අඩංගුවට ගත් හෙරොයින් ප්‍රමාණය 2019 වසරට සාපේක්ෂව පහල යාමක් 2020 වසරේ දැකිය හැකි අතර, එනම් 2019 වසරේ හෙරොයින් කිලෝ ග්‍රෑම් 2101යි ග්‍රෑම් 691 යි මිලිග්‍රෑම්246 ක් අත්අඩංගුවට පත්ව ඇති අතර 2020 වසරේ එම ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 574 ග්‍රෑම් 445 මිලි ග්‍රෑම් 15කි.

මෝර්ෆින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි ගත්විට වගුවට අනුව ක්‍රමික පහළ යාමක් පසුගිය වසර තුන තුළ දක්නට ලැබේ. ඒ අනුව 2018 වසරේ වැරදි 254 ක් වාර්තා වී ඇති අතර 2019 වසරේ එය 18 ක් දක්වා විශාල අඩුවීමක් දැකිය හැකිය. 2020 වසරේ මෝර්ෆින් සම්බන්ධ වැරදි 5 ක් දක්වා තවදුරටත් 2019 වසරට සාපේක්ෂව 72% කින් පහළ ගොස් ඇත. වාර්තා වූ සියළු මෝර්ෆින් වැරදි සඳහා නඩු පවරා ඇති අතර වරදකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව 5 දෙනෙකි.

කොකේන් සම්බන්ධ වැරදි 49 ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර එය 2019 වසරේ වාර්තා වූ වැරදි 133 ට සාපේක්ෂව 63% ක පහළ යාමකි. නඩු පැවරීමේ ප්‍රතිශතය 94% කි. කොකේන් සම්බන්ධ වැරදි සම්බන්ධයෙන් පුද්ගලයින් 31 දෙනෙකු වරදකරුවන් බවට පත්කර ඇත.

මත්ද්‍රව්‍ය සම්බන්ධ සමස්ථ අපරාධ සලකා බැලිමේදි 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ 3% ක ඉහළ යාමක් දැකිය හැකි ය. සමස්ථ මත්ද්‍රව්‍ය අපරාධවල විසඳීමේ ප්‍රතිශතය 91% කි. 2020 වසරේ අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 8416 කට අධික වන අතර මෙම අපරාධ සම්බන්ධයෙන් වරදකරුවන් වූ සමස්ථ පුද්ගලයින් සංඛ්‍යාව 101613 කි.

❖ **පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය සිදුකළ වැටලීම්**



**කේරල ගංජා කිලෝ 170 ග්‍රෑම් 424ක් අත්අඩංගුවට ගැනීම**



**කෘතිම අර්තාපල් ලෙස හෙරෝයින් කිලෝ 99 ග්‍රෑම් 478 ක් අත්අඩංගුවට ගැනීම**



**LSD මුද්දර 3150 ක් අත්අඩංගුවට ගැනීම.**



**හෙරෝයින් කි.ගැ. 437 ග්‍රෑම් 38 ක් සහ මෙතැම්පිටමීන් කි.ගැ. 130 ග්‍රෑම් 474 ක් අත්අඩංගුවට ගැනීම**



**හෙරෝයින් කි.ග්‍රෑම්. 74 ග්‍රෑ.666 සහ මෙතැම්පිටමින් කි.ග්‍රෑම්. 65 ග්‍රෑම් 714 ක් අත්අඩංගුවට ගැනීම.**



**හෙරෝයින් කි.ග්‍රෑම්. 225 ග්‍රෑ.969 ක් අත්අඩංගුවට ගැනීම.**

## 2.3 සුරා බදු වැරදි

පසුගිය වසර කිහිපයෙහි වාර්තා වූ සුරාබදු වැරදි සන්සන්දනාත්මකව සලකා බැලිමේදි 2019 වසරට සාපේක්‍ෂව 2020 වසරේ මෙම සුරාබදු වැරදි ඉතා ඉහළ අගයක් ගෙන ඇති බව පහත වගුවට අනුව හඳුනාගත හැකිය.

**සුරා බදු වැරදි සම්බන්ධ වගුව**

| අනු අංකය | වරද | 2018 | | | | 2019 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා කරන ලද සංඛ්‍යාව | නඩු පවරන ලද සංඛ්‍යාව | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | වාර්තා කරන ලද සංඛ්‍යාව | නඩු පවරන ලද සංඛ්‍යාව | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | වාර්තා කරන ලද සංඛ්‍යාව | නඩු පවරන ලද සංඛ්‍යාව | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය |
| 1 | නීති විරෝධි මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ පෙරීම | 11316 | 10242 | 8259 | 91% | 9920 | 9351 | 7076 | 94% | 18166 | 15650 | 11827 | 86% |
| 2 | බලපත්‍රයක් නොමැතිව මහ රා නිෂ්පාදනය කිරීම | 57 | 52 | 47 | 91% | 154 | 113 | 94 | 73% | 214 | 187 | 156 | 87% |
| 3 | නීති විරෝධි ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කිරීම | 133 | 106 | 87 | 80% | 29 | 29 | 21 | 100% | 118 | 113 | 97 | 96% |
| 4 | නීති විරෝධි ලෙස ස්ප්‍රීතු වර්ග නිෂ්පාදනය කිරීම හෝ පෙරීම | 2346 | 1745 | 1473 | 74% | 730 | 696 | 533 | 95% | 714 | 657 | 494 | 92% |
| 5 | නීති විරෝධි මත්පැන් විකිණීම/ ලඟතබා ගැනීම | 100373 | 93526 | 82364 | 93% | 88395 | 80829 | 68880 | 91% | 102965 | 89887 | 88040 | 87% |
| 6 | නීති විරෝධි මහ රා විකිණීම / ලඟතබා ගැනීම | 3801 | 3410 | 2991 | 90% | 3797 | 3737 | 3000 | 98% | 12742 | 11851 | 10036 | 93% |
| 7 | බලපත්‍රයක් නොමැතිව රජයේ අරක්කු විකිනීම හෝ ලීටර් 7.5 කට වඩා ලඟතබා ගැනීම | 4050 | 3759 | 3337 | 93% | 4267 | 4064 | 3690 | 95% | 3953 | 3709 | 3243 | 94% |
| 8 | බලපත්‍රයක් නොමැතිව බියර් වර්ග හා අනෙකුත් මත්පැන් වර්ග විකිණීම/ විකිණීම සඳහා ලඟතබා ගැනීම | 614 | 544 | 473 | 89% | 801 | 772 | 700 | 96% | 804 | 720 | 601 | 90% |
| 9 | නීති විරෝධි ලෙස නිෂ්පාදනය කළ ස්ප්‍රීතු වර්ග ලඟතබා ගැනීම හා විකිණීම | 682 | 642 | 524 | 94% | 939 | 887 | 709 | 94% | 1337 | 1206 | 938 | 90% |
| 10 | නීති විරෝධි මත්පැන් හෝ බලපත්‍රයක් නොමැතිව මහ රා / අනෙකුත් ස්ප්‍රීතු වර්ග/ රජයේ අරක්කු ප්‍රවාහනය කිරීම | 378 | 349 | 247 | 92% | 246 | 241 | 176 | 98% | 701 | 663 | 548 | 95% |
| 11 | නීති විරෝධි මත්පැන් / ස්ප්‍රීතු වර්ග/ මහ රා නිෂ්පාදනයට ගන්නා උපකරණ ලඟතබා ගැනීම | 659 | 630 | 472 | 96% | 499 | 456 | 347 | 91% | 837 | 779 | 632 | 93% |
| 12 | සුරාබදු ආඥාපනත යටතට වැටෙන අනෙකුත් වැරදි | 5404 | 4509 | 3774 | 83% | 2697 | 2506 | 2067 | 93% | 5010 | 4117 | 3258 | 82% |
| | එකතුව | 129813 | 119514 | 104048 | 92% | 112474 | 103681 | 87293 | 92% | 147561 | 129539 | 119870 | 88% |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

නීති විරෝධි මත්පැන් පෙරීම හෝ නිෂ්පාදය කිරිම ගත්විට 2019 වසරේ වාර්තා වි ඇත්තේ වැරදි 9920 කි. 2020 වසරේ එම වැරදි ප්‍රමාණය 18166 ක් දක්වා 80% කින් ඉහළ ගොස් ඇත. වාර්තා වූ වැරදි වලින් වැරදි 15650 ක් එනම් 86% ක් සඳහා නඩු පවරා ඇති අතර වරද කරුවන් විමෙන් අවසන් වූ නඩු සංඛ්‍යාව 10953 කි.

බලපත්‍රයක් නොමැතිව මහරා නිෂ්පාදනය කිරීමේ වැරදි 154 ක් 2019 වසරේ වාර්තා වි ඇති අතර ඊට සාපේක්ෂව 2020 වසරෙහි මෙම වැරදි 214 ක් දක්වා 39% කින් ඉහළ ගොස් ඇත. මෙම වැරදි 214 න් 187 ක් සඳහා එනම් 87% ක් සඳහා නඩු පවරා ඇත. වරදකරුවන් විමෙන් අවසන් වූ නඩු සංඛ්‍යාව 156 කි.

වගුවට අනුව නීති විරෝධි ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කිරිමේ වැරදි 2020 වසරේ ඉතා ඉහළ ප්‍රතිශතයක් 2019 වසරට සාපේක්‍ෂව වාර්තා වි ඇති අතර 2019 වසරේ වාර්තා වු වැරදි 29 ට සාපේක්‍ෂව 2020 වසරේ වැරදි 118 ක් දක්වා 307% කින් ඉහළ ගොස් ඇත. නඩු පැවරු සංඛ්‍යාව 113 ක් එනම් ප්‍රතිශතයක් ලෙස 96% කි. ඉන් වරදකරුවන් විමෙන් අවසන් වු නඩු සංඛ්‍යාව 97කි.

සුරාබදු වැරදි වල ඉතා ඉහළ අගයකින් වාර්තාවන නීති විරෝධි මත්පැන් විකිණිම හෝ ළඟ තබා ගැනිම යන වැරදි 2019 වසරේ 88395 ක් වාර්තා වු අතර 2020 වසරේ එම වැරදි 102965 ක් දක්වා 16% කින් ඉහළ ගොස් ඇත.

නීති විරෝධී මත්පැන් විකිණීම / ළඟ තබා ගැනීම සම්බන්ධ වැරදිවල නඩු පැවරීම ප්‍රතිශතයක් ලෙස 87% කි. සිද්ධි 89887 ක් සඳහා නඩු පවරා ඇති අතර ඉන් නඩු 69944 ක් එනම් 78% ක් වරද කරුවන් කොට අවසන් වි ඇත.

වගුවට අනුව නීති විරෝධි මහරා විකිණිම / ළඟ තබා ගැනිම යන වරද 2019 වසරට සපේක්‍ෂව 2020 වසරේ විශාල ලෙස ඉහළ ගොස් ඇති අතර බල පත්‍ර නොමැතිව රජයේ ආරක්කු විකිණිම හෝ ලීටර් 7.5 ට වඩා ලඟ තබා ගැනිමේ වැරදි 2019 වසරට සාපේක්‍ෂව 2020 වසරේ 7% කින් ද නීති විරෝධිව නිෂ්පාදනය කළ ස්ප්‍රීත්තු වර්ග ලඟ ලබා ගැනිම හා විකිණිම 42% කින්ද, සුරාබදු අඥාපනත යටතට ගැනෙන අනෙකුත් වැරදි 86 % කින්ද 2020 වසරේ ඉහළ ගොස් ඇත.

සමස්ථයක් ලෙස 2019 වසරේ වාර්තා වු සියළුම සුරාබදු වැරදි 112414 ට සාපේක්‍ෂව 2020 වසරේ එම වැරදි 147561 දක්වා 31% කින් ඉහළ ගොස් ඇති අතර සමස්ථ නඩු පැවරීම් සංඛ්‍යාව 129539 කි. ඉන් 77% ක් එනම් වැරදි 100303 ක් අධිකරණයේ වරදකරුවන් විමෙන් අවසන් කර ඇත.

සුරාබදු වැරදි සඳහා 2019 වසරේ වරදකරුවන් වු සංඛ්‍යාව 91184 ක් වු අතර ඉන් 86606 දෙනෙකු පුරුෂයින්ය. කාන්තාවන් සංඛ්‍යාව 4537 කි. 2020 වසරේ සමස්ථ වරදකරුවන් සංඛ්‍යාව 119870 ක් වු අතර ඉන් 115520 ක් පුරුෂයින් ද 4218 ක් කාන්තාවන් ද විය. ඒ අනුව 2019 වසරට සාපේක්‍ෂව 2020 වසරේ වරදකරුවන් සංඛ්‍යාව මෙන්ම සමස්ථ සුරාබදු වැරදි සංඛ්‍යාව 31% කින් ඉහළ ගොස් ඇත.

## 2.4 විශේෂ කාර්ය බලකාය මගින් සිදුකළ සමස්ථ වැටලීම්

ශ්‍රී ලංකා පොලීසිය මගින් සිදුකරනු ලබන මත්ද්‍රව්‍ය, සුරාබදු, අවි ආයුධ, පාරිසරික විනාශයන් සම්බන්ධ වැටලීම් සහ වෙනත් සියළුම වැටලීම් සඳහා විශේෂ කාර්ය බලකායේ දායකත්වය ද හිමිවේ. ඒ යටතේ ඉහත දක්වන ලද ක්ෂේත්‍රයන්ට අදාළව 2020 වසරේ විශේෂ කාර්ය බලකාය මගින් සිදුකරන ලද සමස්ථ වැටලීම් පහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

## විශේෂ කාර්ය බලකා වැටලීම්

| වැටලීමේ ස්වභාවය | සිදුවීම් ගණන | සැකකරුවන් ගණන |
|---|---:|---:|
| අවි ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය | 475 | 304 |
| මත්ද්‍රව්‍ය වැටලීම් | 235 | 2170 |
| සුරාබදු වැටලීම් | 1155 | 1155 |
| පාරිසරික විනාශයන් සම්බන්ධ වැටලීම් | 2479 | 2983 |
| වෙනත් වැටලීම් | 622 | 987 |
| එකතුව | 7087 | 7,599 |

මූලාශ්‍රය - පොලිස් විශේෂ කාර්ය බලකාය

❖ පොලිස් විශේෂ කාර්ය බලකාය මඟින් සිදුකරන ලද වැටලීම් දැක්වෙන ඡායා රූප



අත්අඩංගුවට ගත් අයිස් මත්ද්‍රව්‍ය හා මුදල්



අත්අඩංගුවට ගත් නීති විරෝධි මත්පැන්



අත්අඩංගුවට ගත් හෙරෝයින්



අත්අඩංගුවට ගත් කෙරල ගංජා තොගයක්



අත්අඩංගුවට ගත් ගජමුතු



අත්අඩංගුවට ගත් මත් පෙති

## 2.5 රිය අනතුරු

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන රිය අනතුරු ඛාණ්ඩ 04 කට වර්ග කොට දක්වා ඇති අතර පසුගිය 2018,2019,2020 වසර 03 ට අදාළව සංක්ෂිප්තව පහත වගුව මගින් දත්ත ඉදිරිපත් කොට ඇත.

| රිය අනතුරු | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ අනතුරු | එකතුව | මියගිය ගණන | වාහන සංඛ්‍යාව | වාහන **1000** කට අනතුරු සංඛ්‍යාව |
| 2018 | 2994 | 8795 | 12138 | 11918 | 35845 | 3151 | 7727921 | 5 |
| 2019 | 2645 | 7718 | 10679 | 9391 | 30433 | 2839 | 8095224 | 4 |
| 2020 | 2040 | 6619 | 8909 | 5847 | 23415 | 2144 | 8297852 | 3 |

❖ මෙහි ඇතැම් දත්ත වෙනස් වීමට භාජනය විය හැක මූලාශ්‍රය - රථවාහන පොලිස් මූලස්ථානය

වගුවෙහි ඇතුළත් දත්ත විස්තරාත්මකව විමසා බැලීමේ දී එම වසර 03 හි සෑම වර්ගයකටම අයත් රිය අනතුරුවල සැලකිය යුතු අඩුවීමක් හඳුනාගත හැකිය. 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ මාරක රිය අනතුරු 2645 සිට 2040 දක්වා 23% කින් පහළ ගොස් ඇත.

බරපතල තුවාල රිය අනතුරුවල 2020 වසරේ පහත වැටීම සළකා බැලීමේ දී 2019 වසරේ දී 7718 සිට 2020 වසරේ 6619 ක් දක්වා 14% ක පහළ යාමක් හඳුනා ගත හැකිය.

සුළු තුවාල අනතුරු 10675 සිට 8909 ක් දක්වා 16% කින් 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ පහත වැටී ඇත. එමෙන්ම අලාභ අනතුරු වල පහළ යාම 2019 වසරේ 9391 සිට 2020 වසරේ 5847 ක් දක්වා 38% කි.

සමස්ථ රිය අනතුරු වල ස්වභාවය සලකා බැලීමේදී 2019 වසරේ වාර්තා වූ මුළු රිය අනතුරු සංඛ්‍යාව 30433 ක් වූ අතර එය 2020 වසරේ 23415 ක් දක්වා 23% කින් පහත වැටී ඇත.

වගුවට අනුව පසුගිය වසර තුනෙහි රිය අනතුරු මෙන්ම රිය අනතුරු මරණ සැළකිය යුතු අඩුවීමක් දක්නට ඇත. ඒ අනුව 2839 ක් වූ 2019 වසරේ රිය අනතුරු මරණ සංඛ්‍යාව 2020 වසරේ 2144 ක් දක්වා 24% කින් අඩු වී ඇත.

2020.12.31 දිනට මෙරට ලියාපදිංචි මෝටර් රථ වාහන සංඛ්‍යාව 8297852 ක් වේ. ඒ අනුව 2020 වසරේ වාහන 1000 කට රිය අනතුරු සංඛ්‍යාව දළ වශයෙන් 3 කි. 2020 වසරේ රිය අනතුරු දත්ත විශ්ලේෂණය කිරීමේදී දක්නට ලැබෙන සෑම වර්ගයකම අනතුරු වල පහළ යාම සහ රිය අනතුරු මරණවල දක්නට ලැබෙන සැලකිය යුතු අඩුවීමට එක් ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැක්කේ පැවති කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රවාහන හා ගමනාගමන කටයුතු බොහෝ දුරට සීමා වීම සහ බොහෝ ප්‍රදේශ හුදකලා කරමින් නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීමයි.

## 2.6 ප්‍රජා පොලිස් කමිටු

| 2020 ප්‍රජා පොලිස් කමිටු පැවැත්වීම සහ දැනුවත් කිරීම. | | | | | | |
|---|---|---|---|---|---|---|
| මහජන ආරක්ෂක කමිටු | | උපදේශන කමිටු | | ස්ථාන කමිටු | | සමස්ථ දැනුවත් කිරීම |
| පැවැත්විය යුතු සංඛ්‍යාව | පවත්වා ඇති සංඛ්‍යාව | පැවැත්විය යුතු සංඛ්‍යාව | පවත්වා ඇති සංඛ්‍යාව | පැවැත්විය යුතු සංඛ්‍යාව | පවත්වා ඇති සංඛ්‍යාව | |
| **170496** | **92548 (54%)** | **5868** | **2188 (37%)** | **1956** | **888 (45%)** | **292405** |

**මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය**

වගුවට අනුව ප්‍රජා පොලිස් කමිටු වර්ග 03 ක් සඳහන්ව ඇති අතර මහජන ආරක්ෂක කමිටු, උපදේශන කමිටු සහ ස්ථාන කමිටු ලෙස එම වර්ග තුන දැක්විය හැකිය. 2020 වසරේ මෙම කමිටු පැවැත්වීම පිළිබඳ සළකා බැලීමේ දී මහජන ආරක්ෂක කමිටු පැවැත්විය යුතු සංඛ්‍යාව 170496 ක් ලෙස දක්වා ඇති අතර පවත්වා ඇති කමිටු සංඛ්‍යාව 92548 කි. එය ප්‍රතිශතයක් ලෙස 54% කි.

2020 වසරේ පැවැත්විය යුතු උපදේශන කමිටු සංඛ්‍යාව 5868 ක් වූ අතර පවත්වා ඇති කමිටු සංඛ්‍යාව 2188 කි. එය ප්‍රතිශතයක් ලෙස 37% කි.

වගුවට අනුව 2020 වසරේ පැවැත්විය යුතු ස්ථාන කමිටු සංඛ්‍යාව 1956 ක් ලෙස දක්වා ඇති අතර ඉන් පවත්වා ඇත්තේ කමිටු 888 කි. එය ප්‍රතිශතයක් ලෙස 45% කි.

ඒ අනුව 2020 වසරේ පැවැත්විය යුතු සමස්ථ කමිටු සංඛ්‍යාව 178320 ක් වූ අතර ඉන් පවත්වා ඇති සමස්ථ කමිටු සංඛ්‍යාව 95624 කි. එය ප්‍රතිශතයක් ලෙස 54% කි. කමිටු පැවැත්වීම මෙසේ පහළ අගයක් ගැනීමට රටේ පැවති කොවිඩ් - 19 වසංගත රෝගී තත්ත්වය ප්‍රධානම හේතුවක් වී ඇත.

## 2.7 නිෂ්කාශන වාර්තා

දේශීය හා විදේශීය නිෂ්කාශන අයදුම්පත් සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම ශ්‍රී ලංකා පොලීසිය විසින් සිදුකරනු ලබන ඉතා වැදගත් කාර්යයක් ලෙස සැලකේ. 2020 වසරේ නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම සම්බන්ධයෙන් අත්කරගෙන ඇති ප්‍රගතිය පහත වගුව මගින් දක්වා ඇත.

**නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම**

| අයදුම්පත් වර්ගය | ලද අයදුම්පත් ප්‍රමාණය | නිකුත්කළ වාර්තා ප්‍රමාණය | ප්‍රතිශතය | නිකුත් කිරිමට ඇති වාර්තා ප්‍රමාණය | ලද මුදල (රුපියන්) |
|---|---|---|---|---|---|
| දේශීය නිෂ්කාශන වාර්තා (ඕල්කට් මාවත අයදුම්පත් භාර ගන්නා කාර්යාල මගින් online මගින්) | 35763 | 31962 | 89.3 | 3801 | 49,178,500.00 |
| විදේශීය නිෂ්කාශන වාර්තා (තානාපති කාර්යාල මගින්) | 434 | 342 | 78.8 | 92 | 651,000.00 |
| **එකතුව** | **36197** | **32304** | **89.9** | **3893** | **49,829,500.00** |

මූලාශ්‍රය - පොලිස් මූලස්ථානය

වගුවෙහි දත්ත වලට අනුව 2020 වසරේ ශ්‍රී ලංකා පොලීසිය වෙත දේශීය නිෂ්කාශන වාර්තා සඳහා අයදුම්පත් 35763 ක් ලැබී තිබු අතර ඉන් 31962 ක් සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කර ඇත. ප්‍රතිශතයක් ලෙස එය 89% කි.

විදේශීය අයදුම්පත් 434 ක් ලැබි තිබු අතර ඉන් 342 ක් සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කර ඇත. එය 79% ක ප්‍රතිශතයකි. ඒ අනුව සමස්ථයක් ලෙස අයදුම්පත් 36197 ක් ලැබි ඇති අතර ඉන් 32304 ක් එනම් 89% ක් සඳහා නිෂ්කාශන වාර්තා නිකුත්කර ඇති අතර උපයාගෙන ඇති ආදායම රුපියල් මිලියන 50 ට ආසන්න වේ.

## 2.8 නව තාක්ෂණික උපාය මාර්ග භාවිතා කිරීමේ ප්‍රගතිය

### 2.8.1 අපරාධ මැඩලීම

- ❖ දුරකථන විශ්ලේෂණ වාර්තා මගින් අපරාධකරුවන් හඳුනා ගැනීම
- ❖ අපරාධකරුවන් හඳුනා ගැනීම සඳහා (CCTV) කැමරා තාක්ෂණය පුළුල් ලෙස භාවිතා කිරීම සිදු කරනු ලබයි.

- ❖ VPN තාක්ෂණය මගින් සැකකරුවන් නියාමනය කිරීමේ දත්ත පද්ධතිය (AMIS) සහ ස්වයංක්‍රීය ඇඟිලි සටහන් හඳුනා ගැනීමේ දත්ත පද්ධතිය (AFIS) අපරාධ විමර්ශන කටයුතු සඳහා ඉතා සාර්ථක ලෙස යොදා ගැනේ. දිවයිනේ සියළුම පොලිස් ස්ථාන මෙම දත්ත පද්ධතිය සමඟ සම්බන්ධ කර ඇත.

- ❖ නැති වූ හෝ සොරකම් කරන ලද දේපළ හඳුනා ගැනීම (SAIS) සඳහා වූ පරිගණක පද්ධතිය දිවයිනේ සියළුම පොලිස් ස්ථාන සමඟ ජාලගත කර ක්‍රියාත්මක කෙරේ.

- ❖ විශේෂ පරිගණක පද්ධතියක් මගින් දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවන් (IRC) පිළිබඳව තොරතුරු ක්ෂණිකව විමර්ශන කටයුතු සඳහා ලබා ගැනීමේ හැකියාව පවතී.

**2.8.2 මත්ද්‍රව්‍ය නිවාරණය**

- ❖ විවිධ විෂ මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම, අත්අඩංගුවට ගැනීම සහ විමර්ශන කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගනු ලබන අතර ඒ යටතේ රොබෝ තාක්ෂණය භාවිතා කරනු ලබයි.

**2.8.3 රථවාහන පාලනය**

- ❖ අධිවේගී මාර්ගයේ රාජකාරී සඳහා අධිතාක්ෂණික වේග මාපකයන්ත්‍ර (Trucam) භාවිතා කෙරේ.

- ❖ මාර්ග නීති කඩකරන්නන් හඳුනා ගැනීම සඳහා නවීන CCTV කැමරා තාක්ෂණය යොදා ගනු ලැබේ.

**2.8.4 මානව සම්පත් සංවර්ධනය**

- ❖ පොලිස් සේවයට බඳවා ගැනීමේදි ලැබෙන අයදුම්පත් වල සුදුසු / නුසුදුසු බව පරිගණක වැඩසටහනක් මගින් තෝරා ගනු ලබයි.

- ❖ බඳවා ගැනීම් වලට අදාළව පොලිස් ස්ථාන මගින් කැඳවනු ලබන වාර්තා VPN තාක්ෂණය ඔස්සේ සිදුකරනු ලබයි.

- ❖ නිෂ්කාශන වාර්තා අයදුම්කිරීම, සහතිකපත් නිකුත් කර ඇත්ද යන්න සොයා බැලීම සහ ඒ සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීම තොරතුරු තාක්ෂණය ඔස්සේ සිදුකිරීමේ පහසුකම් සලසා ඇත.

- ❖ නිෂ්කාශන වාර්තා නිකුත් කිරීමට අදාල සියළුම ආයතන VPN තාක්ෂණය ඔස්සේ ජාලගතකර ඇත.

### 2.8.5 පොලිස් රෝහල

- ❖ ප්‍රතිකාර ලබාගැනීමට පැමිණෙන රෝගීන් ගේ පහසුව සඳහා නවීන තාක්‍ෂණය භාවිතයෙන් දැනට ක්‍රියාත්මක සෞඛ්‍ය තොරතුරු පද්ධතිය (Helth Information System) මගින් පැරණි සායන ගොණු වෙනුවට නවීන තාක්‍ෂණයෙන් යුතු “බා කෝඩ්” පතක් නිකුත් කරනු ලබයි.

## 2.9 ශ්‍රී ලංකා පොලිසියේ ඉදිරි ඉලක්ක

ශ්‍රී ලංකා පොලීසිය සිය කාර්ය භාරයන් ඉදිරියේදි වඩාත් කාර්යක්‍ෂමව හා ඵලදායි අයුරින් ඉටුකිරීම සඳහා ඉලක්කගත ව්‍යාපෘති හා වැඩසටහන්, අපරාධ මර්ධනය, මත් උවදුර මැඩලීම, නව තාක්‍ෂණික උපාය මාර්ග භාවිතය, රිය අනතුරු අවම කිරිම, භෞතික හා මානව සම්පත් සංවර්ධනය, වෛද්‍ය සේවය යන අංශ යටතේ පහත අයුරින් ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කෙරේ.

### 2.9.1 අපරාධ මැඩලීම.

- ❖ ජාතික සහ ආගමික සංහිදියාවට බාධා පමුණුවන අන්තවාදී ක්‍රියා සහ කවර හෝ ත්‍රස්තවාදයක් ඇති විම වළක්වා ගැනිම සඳහා පවතින බුද්ධි අංශ තවදුරටත් පුළුල් කිරීම සහ නිලධාරින්ට අවශ්‍ය වැඩිදුර පුහුණු විම් ලබාදීම තුළින් බුද්ධි තොරතුරු ලබා ගැනීම ඉහළ මට්ටමට ගෙන ඒම.

- ❖ සංවිධානාත්මක අපරාධකරුවන්, විවිධ අපරාධ කල්ලි විසින් සිදු කරනු ලබන දරුණු අපරාධ වැළැක්විම සඳහා අපරාධ කල්ලි ජාලයන් අත්අඩංගුවට ගැනිමේ මෙහෙයුම් තවදුරටත් තීව්‍ර කිරීම.
- ❖ කොල්ලකෑම් ගෙවල් බිඳීම් හා මහාපරිමාණ සොරකම් වලට සම්බන්ධ අපරාධකරුවන් අත්අඩංගුවට ගැනිමේ වැඩ පිළිවෙල තවදුරටත් ප්‍රවර්ධනය කර එම අපරාධ අවම මට්ටමට ගෙන ඒම.

- ❖ දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ හා අධිකරණයෙන් ඇප ලබා සිටින සැකකරුවන් පිළිබඳ ආවේක්‍ෂණ කටයුතු නුතන තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ සිදුකරමින් ඔවුන් නැවත අපරාධ කිරිමට ඇති ප්‍රවනතාවය අවම මට්ටමකට ගෙන ඒම.

- ❖ ඇඟිලි සටහන් හඳුනා ගැනීම, අපරාධ ස්ථාන පරික්‍ෂණ කටයුතු ඇතුළු අපරාධ විමර්ශන කටයුතු වඩාත් කාර්යක්‍ෂමව සිදුකිරීම තුළින් අපරාධකරුවන් අත්අඩංගුවට ගැනිම සහ ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරවිමේ කටයුතු වේගවත් කිරීම.

- ❖ පරිගණක අපරාධ මැඩපැවැත්විම සඳහා පළාත් මට්ටමින් පරිගණක අපරාධ හා ජාලගත අපරාධ විමර්ශන ඒකක පිහිටුවිම.

- ❖ ජාලගත අපරාධ සහ සමාජ ජාලා වෙබ් අඩවි භාවිතයෙන් සිදු කරනු ලබන අපරාධ පිළිබඳ විමර්ශන කටයුතු සඳහා ජාලගත ක්‍රියාකාරකම් ආවේක්ෂණය කිරීමේ පැය 24 පුරාම ක්‍රියාත්මක මෙහෙයුම් මැදිරියක් සහ ඊට අනුබද්ධ විමර්ශන ඒකක ආරම්භ කිරීම.

- ❖ මුදල් විශුද්ධිකරණය, ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය, පුද්ගල ජාවාරම සහ තැනැත්තන් වෙළඳාම වැනි අපරාධ පිළිබඳ පවතින සමාජ දැනුවත් භාවය මද බැවින් එම දැනුම ඉහළ මට්ටමට ගෙන ඒම මගින් එබඳු අපරාධ මැඩලීමේ ක්‍රියාවලිය තවදුරටත් වර්ධනය කිරීම.

### 2.9.2 මත්ද්‍රව්‍ය නිවාරණය.

මෙරට සිදුවන බොහෝ අපරාධ වල මූල බිජයක් වන මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරිම ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන ඉලක්කයකි. සමාජයේ සාමය සහ ජන ජීවිතයේ සුරක්ෂිතභාවය සඳහා මත්උවදුර මැඩලිම අත්‍යාවශ්‍ය සාධකයක් බැවින් ඒ සඳහා වන ඉදිරි ඉලක්ක පහත පරිදි වේ.

**අ. මත්ද්‍රව්‍ය සැපයුම් මාර්ග මැඩලිම සඳහා පහත ක්‍රියා මාර්ග ගනු ලැබේ.**

- ❖ වැටලීම් කණ්ඩායම් ප්‍රමාණය ඉහළ නැංවිම.
- ❖ දැනට ස්ථාපිත ප්‍රාදේශිය උප ඒකක සඳහා භෞතික හා මානව සම්පත් තවදුරටත් ලබාදිම තුළින් ඒවා උපරිම ක්‍රියාකාරිත්වයට පත්කිරීම.
- ❖ 2023 වන විට දැනට පවතින ප්‍රාදේශි උප ඒකක ජාලය තවදුරටත් වැඩිකරමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි වැටලීම් පුළුල් කිරිම.
- ❖ මත්තල, රත්මලාන සහ පලාලි ගුවන්තොටුපල වල සහ හම්බන්තොට වරාය පරිශ්‍රවල නව විමර්ශන ඒකක ආරම්භ කිරිම.
- ❖ ගුවන් මගින් හා නාවික මාර්ග ඔස්සේ සිදු කරනු ලබන නීතී විරෝධි මත්ද්‍රව්‍ය සැපයුම් මැඩලිම සඳහා දැනට කටුනායක ගුවන්තොටුපල සහ කොළඹ වරාය පරිශ්‍රවල ස්ථාපිත විමර්ශන ඒකක වල ක්‍රියාකාරිත්වය තවදුරටත් පුළුල් කිරීම.

- ❖ මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ බුද්ධි තොරතුරු රැස්කිරිම සහ ඒ සම්බන්ධ ආවේක්ෂණ රාජකාරි යෙදවීමට අභ්‍යන්තර බුද්ධි තොරතුරු ඒකකයක් ස්ථාපිත කිරීම.
- ❖ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් නීති විරෝධි ලෙස උපයා ගෙන ඇති දේපල වලට එරෙහිව මුදල් විශුද්ධිකරණය වැළැක්විම යටතේ කටයුතු කිරිම සඳහා නව විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරිම.

ආ. මත්ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම මැඩලීම

- ❖ මෙහිදි මත්ද්‍රව්‍ය වලට සුළු වශයෙන් ඇබ්බැහි වී ඇති සහ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමේ තර්ජනයක් ඇති සමාජ කණ්ඩායම් හඳුනා ගෙන ඔවුන් වෙත මනෝවිද්‍යාත්මක උපදේශනය ලබා දෙනු ලැබේ.
- ❖ මනෝ විද්‍යාත්මක උපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් පොලිස් නිළධරයන් වෙත ලබා දීමට නියමිත අතර ඒ සඳහා විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨවල සහාය ලබා ගැනේ.
- ❖ සියළුම සමාජ කොටස් ආවරණය වන පරිදි මත්ද්‍රව්‍ය භාවිතයෙහි ආදීනව පිළිබඳව දැනට සිදුකරනු ලබන දැනුවත් කිරීම් තවදුරටත් වර්ධනය කිරීම තුළින් මත් උවදුර මෙරටින් තුරන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනේ.

ඇ. මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ නඩු කටයුතු ඉතා සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා වෙනම නීති අංශයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිත අතර එමගින් සාක්ෂි වල ඇති දුර්වලතා නිසා විත්තිකරුවන් නිදහස් වීමට ඇති ඉඩකඩ සම්පූර්ණයෙන්ම මගහරවා ගැනීමට ක්‍රියා කෙරේ.

### 2.9.3 රිය අනතුරු අවම කිරීම.

- ❖ රියඅනතුරු අවම කර ගැනීමේ ඉතා වැදගත් පියවරක් වන දැනුවත් කිරීම් සිදු කිරීම යටතේ සමාජයේ සෑම ස්ථරයක්ම නියෝජනය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් විශාල ප්‍රමාණයක් සිදු කිරිම.
- ❖ විවිධ දැනුවත් කිරීම්, ප්‍රදර්ශන කුටි, සංදර්ශන ඉතා ඉහළ මට්ටමකින් පවත්වා රිය අනතුරු 20% කින් අඩු කර ගැනිමේ ඉලක්කය සපුරා ගැනිම.
- ❖ බස්නාහිර පළාත කේන්ද්‍ර කරගනිමින් දිස්ත්‍රික් මට්ටමින් රථ වාහන මෙහෙයුම් ඉතා පුළුල් ආකාරයෙන් සිදු කිරිම.
- ❖ රිය අනතුරු දත්ත උපයෝගි කර ගනිමින්, විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ විශ්ලේෂණාත්මකව රිය අනතුරු බහුල ප්‍රදේශ හඳුනා ගෙන ඊට හේතු වූ විවිධ කරුණු අධ්‍යයනය කොට පිළියම් යෙදිමේ ක්‍රමවේදය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම.
- ❖ රිය අනතුරු බහුලව සිදුවිමට බලපානු ලබන මාර්ග වල දෝෂ ඇතුළු විවිධ තාක්ෂණික දෝෂ හඳුනා ගෙන අදාල අනෙකුත් ආයතන හා එක්ව එම දෝෂ මගහැරවීමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

- ❖ රිය අනතුරු සඳහා බලපානු ලබන ධාවනයට නුසුදුසු වාහන පරීක්ෂා කොට තහනම් නියෝග නිකුත් කිරීමේ මෙහෙයුම් වැඩි කිරීම.
- ❖ නූතන තාක්ෂණික මෙවලම් භාවිතය තවදුරටත් යාවත්කාලීන කරමින් ඒ ඔස්සේ රිය අනතුරු අවම කිරීම සඳහා අවශ්‍ය තාක්‍ෂණික සහාය උපරිමයෙන් ලබා ගැනීම.

- ❖ අද වන විට විශාල ගැටළුවක්ව පවතින මාර්ග තදබදයට පිළියම් යෙදීම සඳහා යොදාගත හැකි පියවරක් ලෙස මාර්ගය අවහිර වන පරිදි වාහන නවතා තැබීම, අවධිමත් වෙළඳාම් ආදි බාධක ඉවත් කිරිම, රියදුරන් නිවැරදි මංතිරු වෙත යොමු කිරීම සඳහා සංඥා පුවරු ස්ථාපිත කිරිම, එක් දිශාවකට රථවාහන ධාවනය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කර සැළසුම් සැකසීම ආදි විවිධ ක්‍රියාමාර්ග, විවිධ අත්හදා බැලීම් ඔස්සේ සිදු කරමින් මාර්ග තදබදය සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන විසඳුම් ඉදිරිපත් කිරීම.

### 2.9.4 මානව සම්පත් සංවර්ධනය.

ශ්‍රී ලංකා පොලීසියේ සියළුම රාජකාරි වල කාර්යක්‍ෂමතාවය හා ඵලදායිත්වය ඉහළ නැංවිම සඳහා පහත අයුරින් මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව අධ්‍යයනය කෙරේ.

I. ශ්‍රී ලංකා පොලිසීයේ රාජකාරි සඳහා අවශ්‍ය කරනු ලබන හට සංඛ්‍යාව ප්‍රමාණවත් පරිදි සපයා ගැනීම යටතේ ප්‍රාදේශීය කොට්ඨාස සහ ක්‍රියාකාරී කොට්ඨාස වෙත පහත අයුරින් නිලධරයන් වෙන් කිරීමට අපේක්‍ෂා කෙරේ.

**ක්‍රියාකාරී සහ ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස සඳහා අවශ්‍ය මුලු හට සංඛ්‍යාව**

| | SDIG | DIG | WDIG | SSP | WSSP | SP | WSP | ASP | WASP | CI | WCI | IP | WIP | SI | WSI | TSI | SM | SMD | PS | WPS | PC |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ප්‍රාදේශීය කොට්ඨාස** | ? | | | | | | | | | | | | | | | | | | | | |
| අවශ්‍ය හටසංඛ්‍යාව | 9 | 26 | 0 | 54 | 0 | 70 | 3 | 155 | 6 | 904 | 61 | 2229 | 151 | 3357 | 469 | 47 | 3 | 0 | 28053 | 2231 | 36768 |
| අනුයුක්ත හටසංඛ්‍යාව | 9 | 21 | 0 | 68 | 0 | 15 | 1 | 109 | 1 | 1417 | 83 | 1698 | 195 | 5325 | 295 | 31 | 10 | 1 | 20293 | 2288 | 18648 |
| ඌන හටසංඛ්‍යාව | 0 | 5 | 0 | -14 | 0 | 55 | 2 | 46 | 5 | -513 | -22 | 531 | -44 | -1968 | 174 | 16 | -7 | -1 | 7760 | -57 | 18120 |
| | | | | | | | | | | | | | | | | | | | | | |
| **ක්‍රියාකාරී කොට්ඨාස** | | | | | | | | | | | | | | | | | | | | | |
| **අවශ්‍ය හටසංඛ්‍යාව** | 4 | 26 | 1 | 92 | 10 | 65 | 6 | 264 | 10 | 835 | 72 | 1281 | 191 | 2877 | 485 | 81 | 55 | 0 | 8543 | 909 | 12451 |
| අනුයුක්ත හටසංඛ්‍යාව | 4 | 23 | 1 | 89 | 7 | 23 | 1 | 119 | 0 | 650 | 75 | 750 | 123 | 1845 | 369 | 48 | 9 | 0 | 5216 | 601 | 7089 |
| ඌනතාවය | 0 | 3 | 0 | 3 | 3 | 42 | 5 | 145 | 10 | 185 | -3 | 531 | 68 | 1032 | 116 | 33 | 46 | 0 | 3327 | 308 | 5362 |
| | | | | | | | | | | | | | | | | | | | | | |
| **මුළු හට සංඛ්‍යාව** | | | | | | | | | | | | | | | | | | | | | |
| **අවශ්‍ය මුළු හටසංඛ්‍යාව** | 13 | 52 | 1 | 146 | 10 | 135 | 9 | 419 | 16 | 1739 | 133 | 3510 | 342 | 6234 | 954 | 128 | 58 | 0 | 36596 | 3140 | 49219 |
| අනුයුක්ත හටසංඛ්‍යාව | 13 | 44 | 1 | 157 | 7 | 38 | 2 | 228 | 1 | 2067 | 158 | 2448 | 318 | 7170 | 664 | 79 | 19 | 1 | 25509 | 2889 | 25737 |
| ඌනතාවය | 0 | 8 | 0 | -11 | 3 | 97 | 7 | 191 | 15 | -328 | -25 | 1062 | 24 | -936 | 290 | 49 | 39 | -1 | 11087 | 251 | 23482 |
| | | | | | | | | | | | | | | | | | | | | | |
| අනුමත හට සංඛ්‍යාව | **12** | **46** | | **169** | **1** | **162** | **4** | **314** | **16** | **780** | **66** | **2699** | **266** | **5312** | **642** | **125** | **100** | **50** | **15315** | **1800** | **45055** |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

II. සාමාන්‍ය පරිදි සිදුකරනු ලබන බඳවා ගැනීම් යටතේ පහත අයුරින් නිලධරයන් බඳවා ගැනීමට නියමිතය.

| අනු අංකය | නිලය | බඳවා ගැනීමට නියමිත අංශ | බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | පොලිස් කොස්තාපල් | සමාන්‍ය පොලීසිය | 1500 | කොටසක් පුහුණුවට කැඳවා ඇත. කොටසකගේ පසුබිම් පරික්ෂණ සිදු කරමින් පවතී. |
| 02 | කාන්තා පොලිස් කොස්තාපල් | සමාන්‍ය පොලිසිය | 1000 | පසුබිම් පරීක්‍ෂණ සිදුකරමින් පවතී |
| 03 | පොලිස් කොස්තාපල් රියදුරු | සමාන්‍ය පොලිසිය | 600 | පසුබිම් පරීක්‍ෂණ සිදුකරමින් පවතී |
| 04 | උප පොලිස් පරීක්‍ෂක | රාජ්‍ය බුද්ධි සේවාව | 73 | පසුබිම් පරීක්‍ෂණ සිදුකරමින් පවතී |
| 05 | උප පොලිස් පරීක්‍ෂක | විශේෂිත අංශ | 96 | පසුබිම් පරීක්‍ෂණ සිදුකරමින් පවති |
| 06 | කාන්තා උප පොලිස් පරීක්‍ෂක | රාජ්‍ය බුද්ධිසේවාව | 05 | පසුබිම් පරීක්‍ෂණ සිදුකරමින් පවති |
| 07 | කාන්තා උප පොලිස් පරීක්‍ෂක | විශේෂිත අංශ | 31 | පසුබිම් පරීක්‍ෂණ සිදුකරමින් පවති |
| 08 | පොලිස් කොස්තාපල් | රාජ්‍ය බුද්ධි සේවා | 550 | ලිඛිත පරීක්‍ෂණය පැවැත්වීමට නියමිතයි |
| 09 | කාන්තා පොලිස් කොස්තාපල් | රාජ්‍ය බුද්ධි සේවා | 25 | ලිඛිත පරීක්‍ෂණය පැවැත්වීමට නියමිතයි |
| 10 | උප පොලිස් පරීක්‍ෂක | සාමාන්‍ය | 240 | සම්මුඛ පරීක්‍ෂණ පැවැත්වීමට නියමිතව ඇත |
| 11 | කාන්තා උප පොලිස් පරීක්‍ෂක | සාමාන්‍ය | 49 | සම්මුඛ පරීක්‍ෂණ පැවැත්වීමට නියමිතව ඇත |
| 12 | පොලිස් කොස්තාපල් | සාමාන්‍ය | 2526 | අවසන් සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීමට නියමිතය |
| 13 | කාන්තා පොලිස් කොස්තාපල් | සාමාන්‍ය | 2217 | අවසන් සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීමට නියමිතය |
| 14 | පොලිස් කොස්තාපල් රියදුරු | සාමාන්‍ය | 462 | අවසන් සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීමට නියමිතය |
| 15 | පොලිස් කොස්තාපල් | විශේෂ කාර්ය බලකාය | 600 | ප්‍රථම සම්මුඛ පරීක්‍ෂණය ක්‍රියාත්මක වේ. |
| 16 | වෛද්‍ය කොට්ඨාසයේ (වෛද්‍යවරුන් හැර ) විවිධ තනතුරු - පිරිමි | වෛද්‍යසේවා කොට්ඨාසය | 63 | අවසන් සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීමට නියමිතය |
| 17 | වෛද්‍ය කොට්ඨාසයේ (වෛද්‍යවරුන් හැර ) විවිධ තනතුරු - ගැහැණු | වෛද්‍යසේවා කොට්ඨාසය | 24 | අවසන් සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීමට නියමිතය |

**මූලාශ්‍රය - පොලිස් ආධුනිකයින් බඳවා ගැනීමේ කොට්ඨාසය**

## III. පුහුණු කිරීම

- ❖ ශ්‍රී ලංකා පොලීසියේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදි සිදුකිරීමට නියමිත බඳවා ගැනීම් මගින් ජනිත වන මානව සම්පත පුහුණු කිරීම සඳහා දැනට ශ්‍රී ලංකා පොලීසිය සතු පුහුණු කිරීමේ මධ්‍යස්ථානවල ධාරිතාව වර්ධනය කිරීම.
- ❖ පුහුණු කිරීමේ කටයුතු අන්තර්ජාලය මගින් සිදු කිරීම තවදුරටත් ප්‍රවර්ධනය කරමින් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් වැඩිදියුණු කිරීම.
- ❖ පරිගණක පුහුණුව හා භාෂා පුහුණුව ලබාදීමේ වැඩසටහන් තවදුරටත් පුළුල් කිරිම
- ❖ සේවාස්ථ පුහුණු ඒකක සඳහා අංගසම්පූර්ණ දේශන ශාලා සකස් කිරීම.
- ❖ උතුරු නැගෙනහිර පළාත්වල ද්‍රවිඩ මාධ්‍යයෙන් පාඨමාලා ආරම්භ කිරීම.
- ❖ ගම්පහ, පානදුර, හලාවත, හම්බන්තොට, කිලිනොච්චිය යන ප්‍රදේශවල නව සේවාස්ථ පුහුණු ඒකක ආරම්භ කිරීම.

## 2.9.5 භෞතික සම්පත් සංවර්ධනය

### I. නව පොලිස් ස්ථාන හා මුරකුටි ආරම්භ කිරීම

පහත අයුරින් නව පොලිස් ස්ථාන හා මුරකුටි දිවයින පුරා ස්ථාපිත කිරීමට යෝජිතය

| කොට්ඨාසය | පළාත | දැනට ස්ථාපිත පොලිස් ස්ථාන සංඛ්‍යාව | නව පොලිස් ස්ථාන සංඛ්‍යාව සහ යෝජිත ශ්‍රේණිය | | | | | යෝජිත මුරකුටි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | A3 | B | C | D | එකතුව | |
| 1 | බස්නාහිර පළාත | 111 | 1 | 2 | 13 | 11 | 27 | 4 |
| 2 | මධ්‍යම පළාත | 63 | | | 14 | 15 | 29 | 9 |
| 3 | දකුණු පළාත | 62 | | | 5 | 17 | 22 | 13 |
| 4 | වයඹ පළාත | 48 | | | 10 | 19 | 29 | 25 |
| 5 | උතුරු පාළාත | 53 | | | | 12 | 12 | 14 |
| 6 | නැගෙනහිර පළාත | 48 | | 1 | 5 | 11 | 17 | 9 |
| 7 | උතුරු මැද පළාත | 33 | | | 5 | 19 | 24 | 7 |
| 8 | ඌව පළාත | 37 | | | 1 | 14 | 15 | 29 |
| 9 | සබරගමුව පළාත | 39 | | | 6 | 15 | 21 | 9 |
| | එකතුව | 494 | 1 | 3 | 25 | 133 | 196 | 119 |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය**

### II. නව පොලිස් ප්‍රාදේශීය කොට්ඨාස ස්ථාපිත කිරීම

- ❖ කැබිතිගොල්ලෑව නමින් නව පොලිස් අධිකාරි කොට්ඨාසයක් ස්ථාපිත කිරීම
- ❖ නුගේගොඩ කොට්ඨාසය තුළ හෝමාගම ලෙස නව කොට්ඨාසයක් ස්ථාපිත කිරීම

**III.** **නව පොලිස් ක්‍රියාකාරී කොට්ඨාස ස්ථාපිත කිරීම යටතේ පහත සඳහන් කොට්ඨාස අභිනවයෙන් ස්ථාපිත කිරීමට නියමිතය.**

- මහජන සාමය කළමණාකරණ කොට්ඨාසය
- ශිෂ්‍යභට කොට්ඨාසය
- සංස්කෘතික කොට්ඨාසය
- කොළඹ පරිසර කොට්ඨාසය
- කොළඹ ප්‍රජා පොලිස් කොට්ඨාසය
- පොලිස්පති ගබඩා කොට්ඨාසය

**IV.** **පොලිස් බල ප්‍රදේශ සීමානිර්ණය කිරීම**

**V.** **ප්‍රාදේශීය පොලිස් ස්ථාන හා අංශ සහ ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස සහ අංශ ශ්‍රේණිගත කිරිම.**

**VI.** **හලාවත මැතිවරණ කොට්ඨාසය තුළ විශේෂ කාර්ය බලකා කඳවුරක් ස්ථාපිත කිරීම**

**VII.** **රට හදන සෞභාග්‍යයේ දැක්ම දස වැදෑරුම් ප්‍රතිපත්තියට අනුව ජාතික ආරක්ෂාවට මුල්තැනදිම යටතේ මහජන ආරක්ෂාව නීතිය හා සාමය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා නවීන තාක්‍ෂණික උපකරණ මිලදි ගැනිම.**

**VIII.** **මිලදී ගනු ලබන සෑම උපකරණයක්ම තිරසාර සංවර්ධන අරමුණු වලට ගැලපෙන පරිදි මිලදි ගැනීම.**

**IX.** **අත්‍යාවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම යටතේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය.**

| අනු අංකය | ව්‍යාපෘතිය | මූල්‍ය වටිනාකම (රු.මි.) |
|---|---|---|
| 1. | පරීක්‍ෂක ශ්‍රේණියේ භට නිවාස සහ භෝජනාගාර ( ව්‍යාපෘති 04) | 483.61 |
| 2. | කනිෂ්ඨ නිලධාරි භට නිවාස ( ව්‍යාපෘති -09 ) | 35.29 |
| 3. | පොලිස් රෝහලේ ඉදිකිරිම් | 19.29 |
| 4. | යාපනය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය | 102 |
| 5. | පොලිස් ස්ථාන ( ව්‍යාපෘති 14 ) | 1827.64 |
| 6. | නේවාසිකාගාර සංකිර්ණය- යාපනය | 55 |
| 7. | පෙරසවි ගොඩනැගිලි ( STC ) | 545 |
| 8. | මිරිහාන ක්‍රිඩා සංකිර්ණය | 371.93 |
| 9. | නාරාහේන්පිට පොලිස් ස්ථානය ( ඉදිකිරිම් ඉතිරි කොටස ) | 112.6 |
| 10. | විශේෂ ආරක්‍ෂක දිසාව - යූනියන් පෙදෙස | 3650 |
| 11. | අපරාධ වාර්තා කොට්ඨාසයේ ආරක්‍ෂක කුටිය | 0.72 |
| 12. | පෙරසවි භට නිවාස 430 ක් ගොඩනැගීම (ව්‍යාපෘති 02) | 4218 |
| 13. | ට්‍රිපිකල් භටනිවාස ( Tripical Barracks ) | 4091.3 |
| 14. | යෝජිත වානේ ගොඩනැගිල්ල | 80 |

**මූලාශ්‍රය - පොලිස් ගොඩනැගිලි කොට්ඨාසය**

## 2.9.6 පොලිස් වෛද්‍ය සේවය.

- ❖ රෝගී ප්‍රතිකාර සේවාවන් වැඩි දියුණු කිරීම යටතේ අක්ෂි ශල්‍ය සේවාවන් ආරම්භ කිරීම සහ විකලාංග ශල්‍ය කර්ම සිදු කිරීමේ කටයුතු වර්ධනය කිරීම.

- ❖ බෝනොවන රෝග සඳහා පවතින නැඹුරුතාවය සැළකිල්ලට ගෙන එබඳු රෝග වළක්වා ගැනීමේ කටයුතු වැඩිදියුණු කිරිම.

- ❖ නිලධරයන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් වැඩිදියුණු කිරීම.

- ❖ ගාල්ල, වාරියපොල, කල්ලඩි, වව්නියා යන ප්‍රදේශ වල පර්යන්ත පොලිස් රෝහල් කඩිනමින් ආරම්භ කිරීම සහ කන්කසන්තුරය නව පොලිස් රෝහලේ පහසුකම් වැඩිදියුණු කිරීම.

- ❖ බෝ නොවන රෝග පාලනය කිරීම සඳහා පොලිස් භෝජනාගාර මගින් ලබා දෙන ආහාර වට්ටෝරු පෝෂණ වේදින්ගේ සහාය ලබා ගෙන සෞඛ්‍යාරක්ෂිත ලෙස සැකසීම.

- ❖ පොලිස් නිලධරයන් සඳහා වෛද්‍ය පරීක්ෂණ වැඩපිළිවෙලක් මාස 06 කට වරක් ක්‍රියාත්මක කිරීම.

- ❖ පොලිස් රෝහල් වල සෞඛ්‍ය තොරතුරු පද්ධති ජාලගත කිරීම, රසායනාගාර වාර්තා සහ ඖෂධ නාමලේඛන රෝගීන් වෙත තොරතුරු තාක්ෂණය ඔස්සේ ලබාදිම සහ මාර්ගගත (online) ක්‍රම ඔස්සේ රොහලේ ලියාපදිංචි විමට අවස්ථාව සැලසීම.

- ❖ මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ වෛද්‍යවරුන් හා සම්බන්ධ වී සෞඛ්‍ය ගැටළු ඉදිරිපත් කිරීමේ පහසුකම් සැලසීම.

## 2.9.7 සේවා ඵලදායිත්වය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නව තාක්‍ෂණික ක්‍රමවේද භාවිතා කිරිම

- ❖ අපරාධකරුවන් හඳුනාගැනීම සහ සමස්ථ අපරාධ විමර්ශන කටයුතු සඳහා CCTV කැමරා තාක්‍ෂණය භාවිතය තවදුරටත් ඉහළ මට්ටමට ගෙන ඒම.

- ❖ VPN තාක්‍ෂණය ඔස්සේ ක්‍රියාත්මක AMIS සහ AFIS දත්ත පද්ධති භාවිතය තවදුරටත් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම් සිදු කිරීමට නියමිතය.

- ❖ අපරාධ විමර්ශන වලදී මුහුණු මගින් අපරාධකරුවන් හඳුනා ගැනීමේ ස්වයංක්‍රීය පද්ධතියක් නිර්මාණය කිරීම.

- ❖ අපරාධ ස්ථානයේ සිටම, සොයා ගන්නා ඇඟිලි සටහන් දත්ත පද්ධතියට යොමු කිරීම මගින් කඩිනමින් අපරාධකරුවන් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික මෙවලම් සපයා ගැනීම සහ අපරාධ ස්ථානයේ දි සොයා ගන්නා අතුල් හා පතුල් සටහන් හඳුනා ගැනීමේ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

- ❖ DNA පරීක්ෂණ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියට DNA රසායනාගාරයක් ස්ථාපිත කිරීමේ හැකියාව අධ්‍යයනය කෙරේ.

- ❖ නව අපරාධ ස්ථාන පරීක්ෂණාගාර 02 ක් කන්කසන්තුරේ සහ මුලතිව් කොට්ඨාස වල පිහිටුවීමේ කටයුතු සිදු කෙරේ.

- ❖ පරිගණක සහ ජාලගත අපරාධ විමර්ශනය සඳහා නව තාක්ෂණය උපරිමයෙන් භාවිතා කිරීම.

- ❖ ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නව තාක්ෂණික උපකරණ සහ උපාය මාර්ග හඳුන්වා දීම පිණිස තාක්ෂණික ආධාරක ඒකකයක් පිහිටුවීමට කටයුතු කෙරේ.

### 2.9.8 රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව

- ❖ රථවාහන මෙහෙයුම් සම්බන්ධයෙන් දැනට භාවිතා වන පැරණි මෝටරෝලා යන්ත්‍ර වෙනුවට ඉතා නවීන මෝටරෝලා යන්ත්‍ර ලබා ගැනීම.

- ❖ කොළඹ රථවාහන පාලන මැදිරි සඳහා නවීන CCTV තිර පද්ධතියක්, GPS සහ ගූගල් තාක්ෂණික උපකරණ සවිකිරීම.

- ❖ ශ්‍රී ලංකා පොලිසීයේ සියළුම රථවාහන අංශ වෙත නවීන ටැබ් යන්ත්‍ර සහ අන්තර්ජාල පහසුකම් ලබාදීම.

- ❖ සියළුම පොලිස් කොට්ඨාස සඳහා 297 බී දත්ත ඇතුළත් කිරීමේ මෘදුකාංගය ( SLADMS ) හඳුන්වාදීම.

- ❖ සියළුම රථවාහන අංශ වලට බීමත් රියදුරන් පරීක්ෂා කිරීමේ යන්ත්‍ර ලබාදීම සහ මත්ද්‍රව්‍ය භාවිතාකර රිය පදවන්නන් පරීක්ෂා කරනු ලබන DRUGTEST යන්ත්‍ර හඳුන්වා දීම.

- ❖ සෑම පොලිස් ස්ථානයකටම නවින වේග මාපක යන්ත්‍ර ලබා දීම.

- ❖ ජංගම දුරකථන මගින් එම ස්ථානයේදීම ඉලෙක්ට්‍රොනික ක්‍රමයෙන් ක්ෂණිකව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

❖ රථවාහන නිලධාරින් සඳහා නිලඇඳුමේ පළඳින Body Worn Camera ලබාදීමට සැළසුම් සකස් කිරීම.

❖ රථවාහන තදබදය හඳුනා ගැනීම සඳහා GPS තාක්‍ෂණය යොදා ගැනීම.

❖ අධිවේගී මාර්ග රියදුරන් සඳහා නවීන තාක්‍ෂණය උපයෝගී කර ගෙන පවතින කාළගුණික තත්ත්වය, සුළගේ ස්වභාවය, ආලෝක තත්ත්වය වැනි වැදගත් තොරතුරු ඩිජිටල් තිර මගින් ලබා දීම.

❖ කොළඹ නගරයේ හඳුනාගත් තවත් ස්ථාන 17ක නවීන CCTV කැමරා ස්ථාපිත කිරීම.

❖ CCTV කැමරා ඔස්සේ ලබා ගනු ලබන දත්ත විශ්ලේෂණය කිරීම සඳහා නවීන තාක්‍ෂණික මෙවලම් සහිත දත්ත විශ්ලේෂණාගාරයක් ස්ථාපිත කිරීම

## 2.9.9 බඳවා ගැනීම් හා නිෂ්කාශන අයදුම්පත්

❖ ශ්‍රී ලංකා පොලීසියට බඳවාගැනිමේ අයදුම්පත් මාර්ගගත ක්‍රමයට (on line ) ලබා ගැනීමේ පහසුකම් ඇති කෙරේ.

❖ නිෂ්කාශන වාර්තා නිකුත් කිරීමේ කාල සිමාව වන දින 14 තවදුරටත් අඩු කර ඉතා ඉක්මණින් වාර්තා නිකුත් කිරීම සඳහා පියවර ගැනේ.

පොලිස්පති,
පොලිස් මූලස්ථානය

සී. ඩී. වික්‍රමරත්න
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

# පරිච්ඡේදය 03

# වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ඒසීඒ-එෆ් |
| | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | |
| | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | | | | |
| | | | | රු. | |
| | | | තත්‍ය | | |
| අයවැය 2020 | | සටහන | 2020 | 2,019 | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 79,379,900,000 | 73,581,466,602 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 1,589,369,753 | 268,679,287 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 365,979,817 | 1,093,069,276 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 2,495,649,086 | 1,898,328,423 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **83,830,898,656** | **76,841,543,588** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **83,830,898,656** | **76,841,543,588** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 60,788,068,000.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 60,735,107,511 | 54,182,342,397 | |
| 16,480,545,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 16,427,769,772 | 16,254,151,043 | ඒසීඒ-2(ii) |
| 719,587,000.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 701,615,126 | 819,303,762 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **77,988,200,000.00** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **77,864,492,409** | **71,255,797,202** | |
| | **මූලධන වියදම්** | | | | |
| 623,193,000.00 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 608,400,467 | 700,628,603 | |
| 781,563,260.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 779,435,550 | 1,605,184,038 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 43,692,740.00 | හැකියා වර්ධනය | 14 | 36,670,848 | 77,554,253 | |
| 6,901,000.00 | වෙනත් මූලධන වියදම් | 15 | 4,536,964 | 13,937,372 | |
| **1,455,350,000.00** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **1,429,043,829** | **2,397,304,266** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **1,929,260,080** | 1,346,300,251 | |
| | **තැන්පතු ගෙවීම්** | | 1,633,029,976 | 383,297,579 | ඒසීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 296,230,104 | 963,002,672 | ඒසීඒ-5 |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **81,222,796,318** | **74,999,401,719** | |
| - | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **2,608,102,338** | **1,842,141,869** | |

**මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පොලිස් මූලස්ථානය**

# 3.3. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| | | | ඒසීඒ-පී |
| **2020 දෙසැම්බර් 31 දිනට** | | | |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය** | | | |
| | | තත්‍ය | |
| | සටහන | **2020** | **2019** |
| | | රු. | රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 26,160,839,028 | 25,386,230,978 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 885,592,229 | 954,557,613 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 10 |
| **මුළු වත්කම්** | | **27,046,431,257** | **26,340,788,601** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 557,569,567 | 578,111,378 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 26,160,839,028 | 25,386,230,978 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 328,022,662 | 371,682,886 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 4,763,359 |
| **මුළු වගකීම්** | | **27,046,431,257** | **26,340,788,601** |

පිටු අංක 06 සිට 42 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 43 සිට 211 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.......................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
තනතුර : ලේකම්, රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
දිනය : 2021.02.

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්
රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා
ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

.......................
ගණන්දීමේ නිලධාරි
නම : සී.ඩී. වික්‍රමරත්න
තනතුර : පොලිස්පති
දිනය : 2021.02.12

සී. ඩී. වික්‍රමරත්න
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

.......................
ප්‍රධාන ගණකාධිකාරි
නම : එන්.කේ.ආර්. පෙරේරා
දිනය : 2021.02.12

එන්. කේ. රේණුකා පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී ලංකා පොලිසිය)
ශ්‍රී ලං.ග.සේ. (I ශ්‍රේණිය)
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පොලිස් මූලස්ථානය

# 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | | |
|---|---|---|
| | | **ජීසීජ්-සී** |
| **2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | |
| | තතය | |
| | **2020**<br>රු. | **2019**<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිහාර, දඩමුදල් සහ බලපත්‍ර | 353,408,152 | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 2,137,585,352 | 459,823,602 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | - |
| අග්‍රිම ලැබීම් | 79,379,900,000 | 73,121,643,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **81,870,893,504** | **73,581,466,602** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 76,845,146,362 | 68,554,044,325 |
| සහනාධාර සහ මාරුකිරීම් | 666,334,345 | 148,498,760 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 3,331,547,658 | 2,913,046,328 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 3,708,331 | 10 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **80,846,736,696** | **71,615,589,423** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **1,024,156,808** | **1,965,877,179** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 4,827,500 | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 366,013,874 | 99,455,184 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **370,841,374** | **99,455,184** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 1,058,568,007 | 956,094,265 |
| අත්තිකාරම් ගෙවීම් | 297,533,311 | 925,820,394 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **1,356,101,318** | **1,881,914,659** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(985,259,944)** | **(1,782,459,475)** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **38,896,864** | **183,417,704** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 1,589,369,753 | 204,643,234 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **1,589,369,753** | **204,643,234** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 1,633,029,976 | (383,297,579) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **1,633,029,976** | **(383,297,579)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(43,660,223)** | **(178,654,345)** |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **(4,763,359)** | **4,763,359** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **4,763,359** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **4,763,359** |

**මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පොලිස් මූලස්ථානය**

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

2020.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය ප්‍රකාශන සකස්කොට ජාතික විගණන කාර්යාලය වෙත 2021 පෙබරවාරි මස 28 දින භාරදී ඇත. එම වාර්තාව තුළ සියලු මූල්‍ය ප්‍රකාශ සටහන් ඇතුළත්කර ඇත.

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| | | | | | රු. 000 |
|---|---|---|---|---|---|
| ආදායම් සංකේතය | ආදායම් සංකේතයේ විස්තරය | ආදායම් ආස්තමේන්තුව | | එකතුකරන ලද ආදායම් | |
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය ( රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
| 2002.01.01 | රජයේ වත්කම් වලින් ලැබෙන ආදායම් - අනෙකුත් කුලී | 116,000 | 116,000 | 116,607 | 100% |
| 2002.02.99 | පොලිය - අනෙකුත් | 38,000 | 38,000 | 29,566 | 100% |
| 2003.04.00 | රජයේ නිලධාරීන්ට ලබා දෙන යතුරු පැදි සම්බන්ධ මූලික ගෙවීම් | 45 | 45 | 45 | 100% |
| 2003.99.00 | විකුණුම් සහ ගාස්තු - අනෙකුත් ලැබීම් | 69,000 | 69,000 | 57,227 | 82% |
| 2003.02.99 | විකුණුම් සහ ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ | 270,000 | 270,000 | 150,009 | 55% |
| 2004.01.00 | සමාජ රක්ෂණ දායක මුදල් | 2,137,369 | 2,137,369 | 2,137,369 | 100% |
| 2006.02.01 | ප්‍රාග්ධන වත්කම් විකිණීම් | 4,828 | 4,828 | 4,828 | 100% |

**මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු**

## 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | තත්‍ය වියදම | උපයොගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 77,348,200 | 77,988,200 | 77,864,492 | 100% |
| ප්‍රාග්ධන වියදම් | 1,336,350 | 1,455,350 | 1,429,043 | 98% |
| එකතුව | 78,684,550 | 79,443,550 | 79,293,535 | 100% |

**මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු**

### 3.8 මු.රේ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන

| | | | | | | රු. 000 |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල %ලෙස |
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| 1 | භාණ්ඩාගාර මෙහෙයුම් | ඉන්ධන බිල්පත් ගෙවීම | 299,114 | 299,114 | 299,114 | 100% |
| 2 | ශ්‍රී ලංකා රේගුව | රේගු ගාස්තු ගෙවීම | 47,463 | 47,463 | 47,463 | 100% |
| 3 | රජයේ කර්මාන්ත ශාලාව | යතුරු ලියන අළුත්වැඩියාව | 11,382 | 11,382 | 11,382 | 100% |
| 4 | රජයේ මුද්‍රණාලය | මුද්‍රණ කටයුතු | 349 | 3,498 | 349 | 100% |
| 5 | ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රවාහන දීමනාව | 967 | 967 | 967 | 100% |
| 6 | විදේශ කටයුතු අමාත්‍යාංශය | ජාත්‍යන්තර පොලිස් ආයතනයේ සාමාජික ගාස්තු | 4,903 | 4,903 | 4,903 | 100% |
| 7 | දුම්රිය දෙපාර්තමේන්තුව | නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු | 182,315 | 182,315 | 182,315 | 100% |
| 8 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා | 366,329 | 366,329 | 366,329 | 100% |

මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු

### 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| | | | | | රු. 000 |
|---|---|---|---|---|---|
| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 22,611,544 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 4,965,726 | | |
| 9153 | ඉඩම් | | 12,247,189 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | 959 | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | 2,121,424 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

මූලාශ්‍රය - ප්‍රධාන ගණකාධිකාරී පරිගණක ඇස්තමේන්තු

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව පොලීසිය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කලට සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව, සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව සහ 2006.12.22 දිනැති PF/423 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයෙහි 4.3 ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සහ කාර්ය සාධන වාර්තාවක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළහැකි වන පරිදි 2011 අංක 44 දරණ ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත යටතේ අරමුදල පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

1.6.2 නොසැසදීම්

(අ) 2020 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ වර්ෂය අග වටිනාකම ACA - 6 අනුව රු.26,160,839,028 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර වත්කම් වාර්තාව අනුව වටිනාකම රු.41,946,843,876 ක් වූයෙන් රු.15,786,004,846 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම අනුව දෙසැම්බර් 31 දිනට ශේෂය රු.885,556,999 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.805,583,741 ක් විය. ඒ අනුව රු.79,973,258 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.3 අත්තිකාරම් ගෙවීම්

2020 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් දෙපාර්තුමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂයක් නොතිබුණ ද ගොඩනැඟිලි කොට්ඨාශය විසින් හබරාදුව නිල සෙවණ නිවාස මිල දී ගැනීම වෙනුවෙන් 2019 වර්ෂයේ ගෙවූ රු.මිලියන 500 ක් හා ඉදිකිරීම් ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 85.68 ක් අත්තිකාරම් ලෙස පැවති අතර නිරවුල් කර නොතිබුණි.

1.6.4 බැරකම් ඇතිකර ගැනීම

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇත්නම් විනා සේවාවන් හෝ සැපයුම් සඳහා කිසිම බැඳීමකට බැඳී නොසිටිය යුතු වුවත්, ප්‍රවර්ථන වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 05 ක්

සඳහා රු.16,133,896 ක් හා මූලධන වැය විෂයයන් 05 ක් සඳහා රු.134,046,332 ක් වශයෙන් වැය විෂයයන් 10 ක ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.150,180,288 ක් බැරකම් සඳහා එළඹී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව එක් එක් අය්‍රීතයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, පනතේ 38 (2) වගන්තිය ප්‍රකාරව එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, පොලිසිය විසින් එවැනි සමාලෝචනයක් සිදු කල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 හිඟ හිටි ණය ශේෂ

විගණනයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේ අයවීම් හිඟ හිටි තිබුණු නිළධාරීන් 3,267 ක ගෙන් අයවිය යුතු ශේෂ වල එකතුව රු.74,295,356 ක් වූ අතර වර්ෂ 03ට වැඩි හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.54,829,167 ක් වී තිබුණි.

### 2.3 වියදම් කළමනාකරණය

මහනුවර පොලිස් කොට්ඨාශයේ ගොඩනැගිලි 78 කට අදාලව ගෙවිය යුතු හිඟ වරිපනම් මුදල රු.මිලියන 2.37 ක් වූ අතර ඒ අතරින් මහනුවර පොලිස් ස්ථානය හා පොලිස් කොට්ඨාශ කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලට පමණක් හිඟ වරිපනම් මුදල රු.මිලියන 1.83 ක් විය.

### 2.4 තැන්පතු

සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පත් ගිණුම් ශේෂ වටිනාකම රු. 236,293,469 ක් විය. මේ අතර 2013 වර්ෂයේදී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු. 11,503,192 ක මුදලක් අදාල කාර්යය සඳහා උපයෝජනය නොකර වසර 07 කට වැඩි කාලයක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.5 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

(අ) 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතේ V කොටසේ ඇතුලත් 'මුදල්' සම්බන්ධ කටයුතුවලට අදාල "ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුදල" පිහිටුවීම හා පනතේ ඊට අදාල 22 සිට 28 දක්වා වූ කාර්යයන් හා කර්තව්‍යයන් සිදුව නොතිබුණි.

(ආ) පොලිස් ත්‍යාග අරමුදල හැර ශ්‍රී ලංකා පොලීසිය යටතේ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 61 ක් පැවති අතර 2020 දෙසැම්බර් 31 දිනට එම අරමුදල් වල මුදල් ශේෂ එකතුව රු.මිලියන 103.37 ක් ද ස්ථාවර තැන්පතුවල ආයෝජන වටිනාකම රු.මිලයන 331.93 ක් ද විය. මෙම අරමුදල් සම්බන්ධයෙන් වූ අරමුදල් කළමනාකරණය, අයවැය, ගිනුම් තැබීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරිම සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 876 හා 877 ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ චෙක්පත් 342 ක වටිනාකම රු. 9,669,888 ක් වූ අතර 2021 මාරතු 31 දින වන විටත් චෙක්පත් 179 ක වටිනාකම වූ රු. 2,438,475 ක් නිරවුල් වී නොතිබුණි.

(ආ) සාමාලෝචිත වර්ෂය අවසාන වන විට තැම්පත් කළ නමුත්, උපලබ්ධි නොවූ චෙක්පත් 58 ක වටිනාකම රු. 1,383,837 වූ අතර 2021 මාර්තු 31 දින වන විටත් චෙක්පත් 45 ක වටිනාකම වූ රු. 492,532 ක් උපලබ්ධි වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී හඳුනානොගත් තැම්පතුවල වටිනාකම රු. 1,967,521 ක් වූ අතර 2021 මාර්තු 31 දින වන විටත් රු. 1,046,880 ක් හඳුනා ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. සංශෝධන සිදුකල යුතු ක්ෂේත්‍ර 16 ක් ද හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට

ක්‍රියාවලියේදී සිදුව තිබූ අවිධිමත් කරුණු නිසා බේරුම්කරණයේදී 2017 ජනවාරි 21 දින ලබා දී තිබූ තීන්දුව වූ හිස්වැසුම් 75,000 සඳහා වූ මුදල සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ගෙවීම ශ්‍රී ලංකා පොලිසිය විසින් ප්‍රතික්ෂේප කරමින් අඛණ්ඩව අධිකරණ ක්‍රියාමාර්ගයක යෙදී තිබුණි. 2020 අගෝස්තු මාසය වන විට හිස්වැසුම් මිලදී ගැනීම සඳහා රු.191,768,632 ක් ද අනෙකුත් ගාස්තු ලෙස රු.45,316.880 ක් ද ගෙවීමට නියමිතව තිබුණි. 2021 ජූනි මාසය වන විටත් අධිකරණ කටයුතු අවසන්ව නොතිබුණු අතර සැපයුම් කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වැඩිවීමේ අවාසියද ශ්‍රී ලංකා පොලිසිය දැරිය යුතුබවට සැපයුම්කරු ඉල්ලා තිබුණි.

(ආ) හබරාදුව "නිල සෙවණ" නිවාස යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. 3,800,000 බැගින් රු.729,600,000 කට නිවාස 192 ක් මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2009 අප්‍රේල් 02 දින වන විට රු. මිලියන 500 ක් අවස්ථා 05 කදී අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. නිවසක වටිනාකම හා විධිමත් පරිදි වැඩ අවසන් කර නිවාස භාර දීම යන කරුණු සම්බන්ධයෙන් වූ ගැටළු 2021 මැයි මස අග වන විටත් නිරවුල්ව නොතිබුණි.

(ඇ) පොලිස් කොස්තාපල් හා පොලිස් සැරයන් නිලධාරීන් සඳහා වර්ෂයකට සපත්තු 60,000 ක් පමණ අවශ්‍ය වුවද 2016 හා ඊට පසු වර්ෂවලදී සපත්තු 300,000 ක පමණ අවශ්‍යතාවයක් පැවතියද 154,850 ක් පමණක් මිලදී ගෙන තිබුණි. සපත්තු 59,000 ක් මිලදී ගැනීමට 2019 ජූලි 26 දින ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර 2020 සැප්තැම්බර් නියැදි (Sample) පරීක්ෂණ සිදුකර තිබුණ ද , 2021 ජූලි 10 දින වන විටත් සැපයුම්කරු සපත්තු 42,500 ක් පමණක් සපයා තිබුණි. වාර්ෂික අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි මිලදී ගැනීම හා ප්‍රසම්පාදන කටයුතු අවසන් වීමට වසර 2 ක පමණ කාලයක් ගත වීම මත පොලිස් නිලධාරීන්ට වාර්ෂිකව ලැබිය යුතු සපත්තු වසර 03 ක සිට ලැබී නොතිබුණි.

(ඈ) අත්තිඩිය පොලිස් විශ්ව විද්‍යාලය සඳහා ලී ඇඳන් 180 ක් මිලදී ගැනීමට රු. මිලියන 2.61 ක් ගෙවා තිබුණි. මීට අදාල තාක්ෂණික පිරිවිතරයේ ලී වර්ගය, අඳක දිග හා පළල යන අවම කරුණු පමණක් ඇතුලත් කර අසම්පූර්ණ පිරිවිතරයක් මත ඇගයීම් සිදුකර භාණ්ඩ සපයා ගෙන තිබුණි.

(ඉ) පොලිසියේ රාජකාරී ඉටුකිරීමට නව ජීප්රථ මිලදී ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගෙන 2018 අගෝස්තු 08 දින අමප/18/1650/828/10-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජීප් රථ 750 ක් (විශේෂ කාර්ය බලකාය සඳහා ජීප්රථ 150 ක් ඇතුළුව) රු. මිලයන 14,100 කට ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (Indian Line of Credit) යටතේ

මිලදී ගැනීමට සැලසුම් කර තිබුණි. වසරකට ජීප් රථ 250 බැගින් වසර 03ක් තුල මිලදී ගැනීමට සැලසුම් කළ ද මීට අදාල ප්‍රසම්පාදන කටයුතු 2021 ජුනි මාසය වන විටත් අවසන්ව නොතිබුණි.

3.3 **වත්කම් කළමනාකරණය**

3.3.1 **ඉඩම් පවරා ගැනීම**

(අ) පේරාදෙනිය පොලිස් ස්ථානය ස්ථාපිත කිරීම සඳහා පේරාදෙනිය විශ්ව විද්‍යාලය විසින් 1995 ජනවාරි 04 දින ලබා දී තිබූ ඉඩම ආපසු භාරදීමේ එකඟතාවය මත නව පොලිස් ස්ථානය පිහිටි භූමියේ ඉදිකිරීම් සිදුකරගෙන යාමට අවසර ලැබී තිබිණි. 2019 දෙසැම්බර් 18 දින පැරණි පොලිස් ස්ථානය පිහිටි භූමිය විශ්ව විද්‍යාලය වෙත භාරදී තිබුණද නව පොලිස් ස්ථානය ඉදිකර ඇති භූමිය 2021 අප්‍රේල් මාසය දක්වාත් පොලිසිය වෙත පවරාගෙන නොතිබුණි.

(ආ) මහනුවර පොලිස් කොට්ඨාශයට අයත් පොලිස් ස්ථාන 06 ක්, නිල නිවාසයක් හා නිවාඩු නිකේතනයක් පොලීසියට අයත් නොවන භූමි තුල පවත්වාගෙන යන අතර ඒවා පවරා ගැනීමේ කටයුතු 2021 අප්‍රේල් මාසය වන විටත් අවසන්ව නොතිබුණි.

(ඇ) පොලිස් අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරිමට මල්වාන පිහිටි අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක් වූ ඉඩම ශ්‍රී ලංකා පොලීසියට පවරා දීම සඳහා 2017 ජුනි මස 20 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද 2021 ජුනි මස වන විටත් පවරාගෙන නොතිබුණි.

3.3.2 **ඌණ උපයෝජිත වත්කම්**

(අ) සපුගස්කන්ද පොලිස් ස්ථානය පිහිටි අක්කර 4 ක ඉඩමෙන් අක්කර දෙකක පමණ භූමියක් 1981 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) නාරාහේන්පිට පොලිස් රෝහල පුළුල් කිරිම සඳහා 2018 වර්ෂය අවසාන වන විට රු. මිලියන 334 ක් වැය කර ඉදිකරන මහල් 6 කින් සමන්විත ගොඩනැගිල්ලේ මහල් 4 ක් 2021 ජුනි මාසය වන විටත් ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමට යෝජිත විශ්වවිද්‍යාලය සඳහා අත්තිඩිය ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තෝරාගෙන තිබුණි. යෝජිත විශ්වවිද්‍යාල භූමිය නිරීක්ෂණයේදී පහත කරුණු අනාවරනය විය.

I) 2021පෙබරවාරි මාසය වන විට ඉහත භූමියෙන් කොටසක් හා ගොඩනැගිලි කොටසක් (දේශන ශාලා හා නේවාසිකාගාර වලට සුදුසු) හමුදාව විසින් භාවිතා කරමින් පැවතුණි. මීට අදාල නීත්‍යාණුකුල පැවරීම් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවුණි.

II) යෝජිත විශ්වවිද්‍යාලය වෙනුවෙන් පොලිස්පති ගබඩාවෙන් 2018 වර්ෂයේ ලැබී තිබූ පරිගණක මේස 75 ක් හා පරිගණක පුටු 75 ක් ඇතුළු ලීබඩු උපකරණ අදාල අරමුණ වෙත භාවිතා නොවීම නිසා ප්‍රයෝජනයට නොගෙන ගබඩාකර තිබුණි.

III) මහල් 10 කින් පමණ ඉදිකිරිමට යෝජිතව වැඩ ආරම්භකර පසුව අත්හැර දමා ඇති වසර 20 වඩා පැරණි අධ්‍යයන සංකීර්ණයේ පාදම (Foundation) වෙනුවෙන් විශාල පිරිවැයක් දරා ඇතත් එහි වියදම, ඉදිකිරීමේ කාල වකවානු හෝ ඉදිරි යෝජනා පිළිබඳ විගණනයට තොරතුරු අණාවරනය නොවුණි. ශ්‍රී ලංකා පොලිසියට විශාල ගොඩනැගිලි අවශ්‍යතාවයක් පැවතියද මෙම අත්තිඩිය භූමිය ඌන උපයෝජිතව දීර්ගකාලයක සිට පවතී.

(ඈ) 2008.03.19 දින උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා වැඩ ආරම්භකර 2018 වර්ෂය අවසාන වන විට රු.8,895,273 ක් වැයකර තිබුණද ඉදිකිරීම් අතරමග නැවතී තිබුණි. 2008 වර්ෂයේ පොලිසියට පවරා දී තිබූ අක්කර 06 ක මෙම භූමියද නිරවුල්කර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඉ) පොලිස් අශ්වාරෝහක කොට්ඨාශය හා රණවිරු සුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2017 සැප්තැම්බර් 28 දින භුක්තිය භාරදී තිබූ හොරණ ඇල්ලකන්ද වත්ත ඉඩමේ අක්කර 75 ක භූමිය අදාල අරමුණ සඳහා යොදාගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 කළමනාකරණ දුර්වලතා

(අ) නැති වූ හෝ සොරකම් කරන ලද භාණ්ඩ හඳුනාගැනීමේ ක්‍රමවේදය (SAIS) යටතේ පොලිස් ගැසට් පත්‍ර III හි පලකර මෙතෙක් හඳුනා ගැනීමට අපොහොසත් වූ සොරකම් කරන ලද භාණ්ඩවල එකතුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට 59,118 ක් වූ අතර ඒ අතර පාපැදි 29,261 ක්, තුවක්කු 12,493 ක් රථවාහන 10,390 ක් හා විවිධ දේපළ 6,974 ක් විය. පොලිස් ස්ථාන විසින් වසර 10 කට පෙර වාර්තා කර තිබූ මෙතෙක් හඳුනා ගැනීමට අපොහොසත් වූ සොරකම් කරන ලද භාණ්ඩ ප්‍රමාණය සියයට 90 ක් විය. 2020 වර්ෂය තුලදී යතුරු පැදි 45 ක් ත්‍රීරෝද රථ 17 ක් ඇතුළු

මෙම හඳුනා ගැනීමේ ක්‍රමවේදයට වාර්තා වී තිබූ සොරකම් කරන ලද දේපළ ප්‍රමාණය 174 ක් වූ අතර ඉයින් පොලිස් ස්ථාන විසින් කෘෂි උපකරණ 3 කට අදාලව පමණක් පොලිස් ස්ථාන විසින් හදුනාගත් බවට තොරතුරු වාර්තා කර තිබුණි. මේ අනුව තොරතුරු වාර්තා කිරීමේ ප්‍රමාදයන් සහ නැති වූ දේපළ පොලිස් ස්ථාන විසින් සොයගැනීමේ ප්‍රමාදයන්ද පැවතුණි.

(ආ) 2009 මැයි 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/2009 යෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය පරිදි යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියළුම නිවාස වල බදු කාලය වසර 05 ක් ලෙස සඳහන් කර තිබුණද මහනුවර පොලිස් කොට්ඨාශයේ නිල නිවාස 37 ක නිලධාරීන් පදිංචි වී සිටින කාලය වසර 10 සිට 24 දක්වා විය. මේ නිසා පොරොත්තු ලේඛනයේ නිල නිවාස අපේක්ෂාවෙන් රැදී සිටින නිලධාරීන්ට දීර්ඝ කාලයක් බලා සිටීමට සිදුවී තිබුණි.

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම.

.(අ) අපරාධ විසදීම

කාන්තාවන්ට එරෙහි හා ළමයින්ට එරෙහි බල අපරාධ විසදීම සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත දැක්වේ.

I. කාන්තාවන්ට එරෙහි බල අපරාධ සිද්ධි 595 ක් වර්ෂය තුල වාර්ත වී තිබූ අතර එයින් සිද්ධි 376 කට අදාලව එනම් සියයට 63 කට අදාලව විමර්ශන අවසන්ව නොතිබුණි. ඒ යටතේ වැඩි සිද්ධි ප්‍රමාණයක් වාර්තා වී තිබුණේ ස්ත්‍රී දූෂණය, බරපතල තුවාල සිදු කිරීම හා මිනී මැරීම සම්බන්ධයෙන් විය. එම අපරාධ වලට අදාල සිද්ධි පිළිවෙලින් 237ක්, 174 ක් හා 82ක් වූ අතර විසදීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 41, සියයට 37, හා සියයට 30, මට්ටමේ විය. වර්ෂය තුල කාන්තාවන් ඝාතන සිද්ධි 82 ක් වාර්තා වී තිබූ අතර 57 ක් විමර්ශන මට්ටමේ තවදුරටත් පැවතීම මත විසදීමේ ප්‍රතිශතය සියයට 25ක් විය.

II. ළමයින්ට එරෙහි බල අපරාධ සිද්ධි 3,162 ක් වර්ෂය තුල වාර්තා වී තිබූ අතර එයින් සිද්ධි 2,003 කට අදාලව එනම් සියයට 63 කට අදාලව විමර්ශන අවසන්ව නොතිබුණි. ඒයටතේ වැඩිම සිද්ධි වාර්තා වී තිබුණේ ස්ත්‍රී දූෂණය, අපහරණය හා බරපතල ලිංගික අපයෝජනය යන සිද්ධි සම්බන්ධයෙන් විය.

එම අපරාධවලට අදාල සිද්ධි පිළිවෙලින් 1,638 ක්, 632 ක් හා 615 ක් වූ අතර විසඳීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 35, සියයට 37 හා සියයට 43 තරම් අඩු ප්‍රතිශතයක පැවතුණි. ළමයින්ට එරෙහි මිනී මැරීම් සම්බන්ධ සිද්ධි 22 ක් වාර්තා වී තිබූ අතර එයින් විසඳීමේ ප්‍රතිශතය සියයට 28 මට්ටමේ පැවතුණි. එමෙන්ම ළමයින්ට එරෙහි මිනි මැරීමට තැත් කිරීමේ සිද්ධි 09 ක් වර්ෂය තුල වාර්තා වී තිබූ අතර එම සිද්ධි 09 වම අදාලව විමර්ශන අවසන්ව නොතිබුණි.

III. අත්අඩංගුවට ගනු ලබන සැකකරුවන්ගේ විස්තර නියාමනය කිරීමේ නව ක්‍රමවේදය (AMIS) අනුව අපරාධ කොට්ඨාශයේ දත්ත සමඟ සැසඳීමෙන් වෙනත් වැරදි සඳහා අවශ්‍ය පුද්ගලයින් ද යන්න තහවුරු කර ගනී. අපරාධ කොට්ඨාශයේ දත්ත පද්ධතිය අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියා පදිංචි අපරාධ කරුවන් 56,666 ක්ද, විවෘත වරෙන්තු කරුවන් 69,762 ක් ද යුධ හමුදාවෙන් පලාගිය පුද්ගලයන් 7,657 ක් ද ගුවන් හමුදාවෙන් පලාගිය පුද්ගලයන් 6,741 ක් ද හා නාවික හමුදාවෙන් පලා ගිය පුද්ගලයන් 11,437 ක් ද වශයෙන් එකතුව පුද්ගලයන් 152,263 කගේ තොරතුරු දත්ත පද්ධතිය තුල පැවතුණි. මේ අතරින් ගුවන් හමුදාවෙන් පලා ගිය තැනැත්තන් සැකකරුවන් ලෙස හඳුනාගැනීම සියයට 25 ක් ද, නාවික හමුදාවෙන් පලාගිය තැනැත්තන් සැකකරුවන් ලෙස හඳුනා ගැනීම සියයට 16 ක් දහා ලියාපදිංචි අපරාධ කරුවන් සැකකරුවන් ලෙස හඳුනා ගැනීම සියයට 13 ක් ද වී තිබුණි. මේ අනුව දත්ත පද්ධතියේ තොරතුරු තැනැත්තන් සැකකරුවන් ලෙස හඳුනා ගැනීමේ ප්‍රවනතාවයක් ඇති බැවින් පොලිස් ස්ථාන මට්ටමින් ඔවුන්ගේ කටයුතු නියාමනය කිරීමේ අවශ්‍යතාවයක් පැවතුණි.

**(ආ) අන්තරායකාරී ඖෂධ භාවිතය හා සංසරණය වැලැක්වීම.**

අන්තරායකාරී ඖෂධ භාවිතය හා සංසරණය වැළැක්වීම ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන කාර්යයකි. ශ්‍රී ලංකා පොලීසියේ මත්ද්‍රව්‍ය කාර්යාංශයෙන් ලබාදී තිබූ තොරතුරු අනුව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, පොලිස් ස්ථාන, විශේෂ කාර්ය බලකාය නාවික හමුදාව ඇතුළු විවිධ ආයතන විසින් තනි තනිව හා ආයතන ඒකාබද්ධව සිදුකළ වැටලීම් වලින් 2019 වර්ෂයේදී හෙරොයින් කි.ග්‍රෑ. 1742 ක් ද ගංජා කි.ග්‍රෑ.7071 ක් ද අත් අඩංගුවට ගෙන තිබුණි. 2020 වර්ෂයේදී හෙරොයින් කි.ග්‍රෑ.1,610 ක්ද, ගංජා කි.ග්‍රෑ.13,962 ක් ද අත් අඩංගුවට ගෙන තිබුණි. මෙම මත්ද්‍රව්‍ය භාවිතය හා සංසරණය වැළැක්වීමේ ක්‍රියාවලිය තුල පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(I) අත්අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ආරක්ෂිත සේප්පු 01 ක් පමණක් තිබූ අතර එහි ගබඩා කලහැකි උපරිම ප්‍රමාණය කි.ග්‍රෑ. 10 ක් පමණක් විය.

(II) 2020 වර්ෂයේ පෙබරවාරි 29 දින සිට 2020 මැයි 15 දින දක්වා කාලය තුල පමණක් අවස්ථා 8 කදී, මෙත්ඇම්පිටමින් හෙවත් අයිස් කි.ග්‍රෑ 791 ක්ද, හෙරොයින් කි.ග්‍රෑ. 694 ක්ද ආරක්ෂිත සේප්පුවලින් බැහැරව ගබඩාකර තිබුණි.

(III) ආරක්ෂිත සේප්පු පිහිටි ස්ථාන CCTV කැමරා පද්ධතියෙන් පැහැදිලිව දර්ශනය වන අයුරින් නොතිබුණි.

(IV) මත්ද්‍රව්‍ය භාවිතාකර සිටින පුද්ගලයන් අත්අඩංගුවට ගැනිමට නීතිමය පසුබිමක් සකස්කර නොමැති බව අනාවරණය වූ අතර, එවැනි පුද්ගලයන් හඳුනාගැනීමේ උපකරණ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හෝ පොලිස් ස්ථාන සතුව නොතිබුණි.

(V) මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදී වාර්තා ලැබීමට මාස 02 – 03 ත් අතර කල්ගතවූ අවස්ථා 01 ක් ද, මාස 03 – 06 ත් අතර කල් ගතවූ අවස්ථා 08 ක් ද, මාස 06ට වැඩියෙන් කල්ගතවූ අවස්ථා 70 ක් ද හඳුනාගෙන තිබුණි. එබැවින් මත්ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා කඩිනම් හා විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවයක් පැවතුණි.

(VI) පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ තොරතුරු පද්ධතිය තුල තොරතුරු ඇතුලත්ව සිටින පුද්ගලයින් සංඛ්‍යාව 581,693 ක් වූ අතර මෙම පද්ධතියේ වේගය අඩුවීම මත දත්ත පරීක්ෂා කිරීම ප්‍රමාද වීම, නව ජාතික හැඳුනුම්පත් පරීක්ෂා කිරීමට නොහැකි වීම වැනි දුර්වලතා පවතින බවට අනාවරණය වුණි.

(ඇ) රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව

(I) පෙර වර්ෂවලට සාපේක්ෂම 2020 වර්ෂයේදී වාර්තා වී තිබූ මාර්ග අනතුරුවල අඩුවීමක් පෙන්නුම් කළද, 2020 වර්ෂයේදී මාරක අනතුරු 2040 ක් ද, බරපතල තුවල අනතුරු 6619 ක් ද, මාර්ග අනතුරුවලින් මියගිය සංඛ්‍යාව 2144 ක් ද වශයෙන් වාර්තා වී තිබුණි.

(II) 2020 වර්ෂයේදී මාරක අනතුරු 100 ඉක්ම වූ හා බරපතල තුවාල අනතුරු 300 ඉක්මවූ පොලිස් කොට්ඨාශ 03 ක් පැවතුණි. අනුරාධපුරය, ගම්පහ සහ කුරුණෑගල පොලිස් කොට්ඨාශ තුනෙහි 2020 වර්ෂයේදී මෙන්ම පෙර වර්ෂවලදීද මාරක අනතුරු හා බරපතල තුවාල අනතුරු ඉහල අගයන් වාර්තා වූ පොලිස් කොට්ඨාශ විය. නුගේගොඩ පොලිස් කොට්ඨාශයෙන්ද මාරක අනතුරු 95 ක් හා බරපතල තුවාල අනතුරු 401 ක් වශයෙන් පෙර වර්ෂවලදී මෙන්ම ඉහල අනතුරු සංඛ්‍යාවක් මාර්තා වී තිබුණි. පොලිස් කොට්ඨාශ 42 අතරෙහි මෙම පොලිස් කොට්ඨාශ 04 හි සිදුවන මාරක හා බරපතල අනතුරු සංඛ්‍යාව, මුළු මාරක හා බරපතල අනතුරු සංඛ්‍යාවෙන් සියයට 20 ඉක්මවා 2018 - 2020 කාලය පුරාම පැවතීමත් නිසා අනතුරු අවම කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුව තිබුණි.

(III) 2020 වර්ෂයට අදාල හඳුනානොගත් අනතුරු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ කොට්ඨාශය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(IV) හලාවත පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථාන 06 ක හා අනුරාධපුර පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථාන දෙකක තිබූ වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ වසර 10 කට වඩා පැරණිවීම මත අක්‍රියවීමෙන් වේගසීමා නඩු ලබාගෙන නොතිබූ අතර, පොළොන්නරුව පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථාන දෙකක වේගසීමා උපකරණ පැවතියද 2019 හා 2020 වර්ෂවල වේගසීමා නඩු ලබා ගෙන නොතිබුණි.

(V) පොලිස් කොට්ඨාශ 05 ක පොලිස් ස්ථාන 17 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළ දී එකම බීමත් රියදුරෙක්වත් අත්අඩංගුවට ගෙන නොතිබුණි.

### 4.2 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පැවති අතර, ශ්‍රී ලංකා පොලීසිය තිරසර සංවර්ධනය අරමුණු 04 ක් යටතේ ඉලක්ක 08 ක් හඳුන්වාගෙන තිබුණි. පාදක වර්ෂය 2016 යොදාගනිමින් දර්ශකයන් ගොඩනැගීම සිදුකරමින් පැවතියද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංඛ්‍යාලේඛනයන් හඳුනාගෙන නොතිබුණි.

## 05. මානව සම්පත් කළමනාකරණය කිරීම

පොලිසියේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 892 | 545 | 343 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 4,352 | 5,229 | 1,154 | 2,031 |
| (iii) | ද්විතික මට්ටම | 87,765 | 76,016 | 25,823 | 14,074 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4,787 | 2,114 | 2,686 | 13 |
| | එකතුව | 97,796 | 83,904 | 30,018 | 16,126 |

දිගු කාලයක සිට නිලධාරීන්ට උසස්වීම් නොලැබීමේ ගැටළුවට විසඳුම් ලෙස පොලීසියේ නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා 2019 ජනවාරි 01, 2019 ජූලි 01, 2020 ජනවාරි 01 හා 2020 පෙබරවාරි 08 යන දිනවල එක් එක් තනතුරේ අනුමත සංඛ්‍යාව නොසලකා දරන්නාට පුද්ගලික වන සේ උසස්වීම් ලබාදීම නිසා ඉහත පුරප්පාඩු හා අතිරික්ත තත්ත්වය පෙන්නුම් කළද මුළු පුරප්පාඩු සේවක සංඛ්‍යාව 13,905 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 13 ක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(I) පොලිස් අධිකාරී තනතුරු 162 න් 86 ක්, එනම් සියයට 53 ක් ද, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරු 169 ක් 39 ක් එනම් සියයට 23 ක් ද 2020 වර්ෂය අවසාන වන විට පුරප්පාඩුව පැවතීම, ශ්‍රී ලංකා පොලීසියේ කළමනාකරණ හා අධීක්ෂණ මට්ටමේ රාජකාරී ඉටු කිරිමට බාධාවක් වී තිබුණි.

(II) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සහකාර පොලිස් අධිකාරී තනතුරු 98 ක් එනම් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 31 ක් පුරප්පාඩු පැවතුණි. නමුත් 2017 – 2020 සිවු අවුරුදු කාල පරිච්ඡේදය තුල මෙම තනතුර සඳහා 14 දෙනෙක් පමණක් බඳවාගෙන තිබුණි.

(III) 2017 – 2020 කාල පරිච්ඡේදය තුල කාන්තා සහකාර පොලිස් අධිකාරි තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබීම මත 2020 වර්ෂය අවසානයේ අනුමත තනතුරු 16 න් 15 ක් පුරප්පාඩුව පැවතුණි.

(IV) පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුර දක්වා වූ තනතුරුවල නිලධාරීන් දීර්ඝ කාලයක් උසස්වීම් නොලබා සිටීම හේතුවෙන් අවස්ථා 03 කදී එනම් 2019 ජනවාරි 01, 2019 ජුලි 01 හා 2020 ජනවාරි 01 යන දිනවල නිලධාරීන් 31,541 දෙනෙකුට උසස්වීම් ලබාදී තිබුණි. මෙම උසස්වීම් ලබාදීමේදී පොලිස් කොස්තාපල් රියදුරු හා පොලිස් සැරයන් රියදුරු තනතුරු සඳහා උසස්වීම් ලබාදී නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට පොලිස් කොස්තාපල් රියදුරු සේවයේ සේවා කාලය වසර 20 ට වැඩි නිලධාරීන් 289 ක් ද පොලිස් සැරයන් රියදුරු සේවයේ සේවා කාලය වසර 20 ඉක්මවූ නිලධාරින් 07 ක්ද විය. මෙම නිලධාරීන්ට උසස්වීම් ලබා දීමේ කටයුතු ප්‍රමාද වෙමින් පැවතුණි.

(V) පොලිස් සහායක සේවය සඳහා 2020 වර්ෂය තුලදී උප පොලිස් පරීක්ෂක නිලධාරීන් 23 ක් ද, කාන්තා උප පොලිස් පරීක්ෂක නිලධාරින් 06 ක් ද නව බඳවා ගැනීම් යටතේ බඳවාගත් පසුවද සහායක සේවා කාර්ය මණ්ඩලයේ තනතුරු 14 ක් සඳහා තවදුරටත් පවතින පුරප්පාඩු වෙනුවෙන් නිලධාරීන් 3,923 ක් බඳවාගෙන නොතිබුණි. මෙම තත්ත්වය ශ්‍රී ලංකා පොලීසියේ වෛද්‍ය කොට්ඨාශය, ගොඩනැගිලි කොට්ඨාශය, තොරතුරු තාක්ෂණ කොට්ඨාශය වැනි අංශයන්ගේ රාජකාරී උපරිම කාර්යක්ෂමතාවයකින් සිදුකර ගෙන යාමට බාධාවක් වී තිබුණි.

(VI) සිවිල් කාර්ය මණ්ඩලය තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වූ තනතුරු 14 අතර ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III පන්තියේ සහකාර අධ්‍යක්ෂවරයෙකුගේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III වන පන්තියේ නිලධාරීන් 12 දෙනෙකුගේද තෘතීය මට්ටමේ රාජ්‍ය කළමනාකාරණ සහකාර අධි ශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුරු 06 ක ද පුරප්පාඩු පැවතුණි. මෙම තත්ත්වය ශ්‍රී ලංකා පොලීසියේ සැලසුම් සම්පාදන කටයුතු, ගණකාධිකරණ කටයුතු හා මානව සම්පත් කළමනාකරණ කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි. මෙම පුරප්පාඩු පිරවීමට අදාල බඳවා ගැනීමේ බලධාරීන් සමඟ එකඟතාවයකට පැමිණ කටයුතු කළ යුතු බව නිරීක්ෂණය විය.

(VII) සිවිල් කාර්ය මණ්ඩලය තුල අනියම්/තාවකාලික කම්කරු ලෙස අනුමත නොවූ තනතුරක 13 දෙනෙක් සේවය කරමින් සිටින අතර අනුමත කාර්ය මණ්ඩලය තුලට ඇතුලත්කර ගැනීමේ කටයුතු අවසන්ව නොතිබුණි.

කේ.කේ.වී ධර්මසිරි
අතිරේක විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## පරිච්ඡේදය 04

## කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%89% | 50%74% |
| අපරාධ විසඳීමේ ප්‍රතිශතය | | 79% | |
| විශේෂ කාර්ය බලකාය දායකත්වය සැපයූ වැටලීම් ගණන | 7082 | | |
| ක්‍රියාකාරී සිවිල් ආරක්ෂක කමිටු හා ක්‍රියාත්මක කළ දැනුවත් කිරීම් වැඩසටහන් ගණන | 95624 | | 54% |

**මූලාශ්‍රය පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය**

## පරිච්ඡේදය 05

## තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.

| අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75% - 100 % |
| 16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතනයක් ගොඩනැගීම. | 16.1 සියලුම ස්ථානයන්හි සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙණෙන ලෙස අඩුකිරීම. | 16.1.1 ස්ත්‍රී පුරුෂ භාවය හා වයස අනුව ජනගහනයෙන් පුද්ගලයන් 100000 කට සියදිවි නසා ගැනීම් වලට ලක්වන සංඛ්‍යාව. | **3074**<br>**13.9**% | | |
| | | 16.1.2 ස්ත්‍රී පුරුෂ භාවය හා වයස අනුව ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට ගැටුම් හා සම්බන්ධ හේතු නිසා සිදුවන මරණ සංඛ්‍යාව | **310**<br>**1**.4% | | |
| | 16.2 ළමුන් කෲර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනයට, සූරා කෑමට, කුට්ටනයට සහ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීම. | 16.1.3 තමන් ජීවත්වන ප්‍රදේශයේ හුදෙකලාව ගමන් බිමන් යාම ආරක්ෂාකාරී ලෙස සිතන ජනගහනයේ ප්‍රමාණය. | | | |
| | | 16.1.4 පසුගිය මාස 12 තුළදී කායික, මානසික හෝ ලිංගික හිංසනයට ගොදුරු වූ ජනගහනයේ ප්‍රමාණය. | **2656** | | |
| | 16.3 සියලු දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම. | 16.2.1 පසුගිය මාසයක කාල සීමාව තුළදී සිය රැකවලුන් අතින් කායික දඬුවම් / හෝ මානසික ප්‍රචණ්ඩත්වයන් අත්විඳීමට සිදු වූ වයස අවුරුදු 1 – 17 දක්වා ළමුන්ගේ ප්‍රමාණය. | **670** | | |
| | | 16.2.2 ස්ත්‍රී පුරුෂ භාවය හා වයස සහ උපයෝජනයේ ස්වරූපය අනුව ජනගහනයේ පුද්ගලයන් 100000 ක් අතරින් මිනිස් ජාවාරමෙහි ගොදුරු බවට පත්වූ පුද්ගලයන් සංඛ්‍යාව. | | | |
| | | 16.2.3 වයස අවුරුදු 18 වන විට ලිංගික හිංසනය අත්විඳ ඇති වයස අවුරුදු 18 – 29 වයස් කාණ්ඩයේ තරුණ කාන්තාවන් සහ පිරිමින්ගේ ප්‍රමාණය. | | | |
| | | 16.3.1 පසුගිය මාස 12 ක කාලය තුළ | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | හිංසනයන්ට ලක්වූ අය අතරින් නිසි බලධාරීන්ගේ නිල වශයෙන් පිළිගත් ගැටුම් සමථකරණ යාන්ත්‍රණයන් වෙත වාර්තා කරන ලද හිංසනයට ලක්වූ පුද්ගලයන් ප්‍රමාණය.<br><br>16.3.2 සමස්ථ සිරකරුවන් සංඛ්‍යාවෙන් දඬුවම් නියම නොකළ රැඳවියන් ප්‍රමාණය. | | | |
| 3. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම. | 3.6. 2030 වන විට මහා මාර්ගවල සිදුවන අනතුරුවලින් ඇති වන තුවාලවීම් සහ මරණ සංඛ්‍යාව අඩුකිරීම. | 3.6.1 මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ අනුපාතය. | 2144<br><br>9% | | |
| 5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | 5.1 කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීම.<br><br>5.2 මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන් ද ඇතුලත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම.<br><br>5.3 ළමා විවාහයන්, බලහත්කාරයෙන් සිදුවන්නා වූ විවාහයන් සහ කාන්තාවන්ගේ ලිංගික අවයව තුවාල කිරීම් වැනි සියලුම හානිකර භාවිතාවන් තුරන් කිරීම. | 5.1.1 ස්ත්‍රී පුරුෂ භාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස් කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිසත් වන නෛතික රාමුවක් පවත්නේද නැද්ද යන්න.<br><br>5.2.1 හිංසා කරන ආකාරය වයස අනුව පසුගිය මාස 12 තුළ වත්මන් හෝ ඊට පෙර සිටි භාරකරුවාගෙන් ශාරීරිකව, ලිංගිකව හෝ මානසික හිංසනයට ලක් වූ කාන්තාවන් හා වයස අවුරුදු 15 හා ඊට වැඩි ගැහැණු දරුවන් ප්‍රමාණය.<br><br>5.2.2 වයස සහ සිදු වූ ස්ථාන අනුව පසුගිය මාස 12 තුළදී හිතෛෂී සහකරුවා හැර සෙසු පුද්ගලයන් අතින් ලිංගික හිංසනයට ලක් වූ කාන්තාවන් සහ වයස අවුරුදු 15 ට වැඩි ගැහැණු දරුවන්ගේ ප්‍රමාණය.<br><br>5.3.1 වයස අවුරුදු 20 – 24 වූ විවාහක හෝ වයස අවුරුදු 15 ට පෙර සහ වයස අවුරුදු 18 ට පෙර එක්ව වාසය කරන කාන්තාවන්ගේ ප්‍රමාණය.<br><br>5.3.2 වයස අනුව, අවුරුදු 15 – 49 කාන්තා කණ්ඩායමේ සුත්රී ලිංගික සුන්නතියට ලක් කරන ලද කාන්තාවන්ගේ ප්‍රමාණය. | | | |

## පරිච්ඡේදය 06

## මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය.

| මට්ටම් අනුව - සමාන්‍ය පොලිස් සේවයේ සේවක සංඛ්‍යාව **2020.12.31** දිනට | | | | | |
|---|---|---|---|---|---|
| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්යාව | අතිරික්ත සංඛ්‍යාව |
| | | අනුමත සංඛ්‍යාව තුළ | අතිරික්ත ධාරිත | | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 725 | 474 | 08 | 243 | 08 |
| තෘතියික මට්ටම | 3811 | 2930 | 2031 | 881 | 2031 |
| ද්විතික මට්ටම | 81067 | 58983 | 14074 | 22084 | 14074 |
| ප්‍රාථමික මට්ටම | - | - | - | - | - |
| එකතුව | **85603** | **62387** | **16113** | **23208** | **16113** |
| | **85603** | **78500** | | **7103** | |

***තෘතිය මට්ටමේ සහ ද්විතික මට්ටමේ තනතුරු වලට අදාලව පුරප්පාඩු ගණනය කිරීමේ දි දරන්නාට පුද්ගලික වන සේ උසස් කර ඇති නිලධරයන්** සංඛ්‍යාව ඉවත් කර පුරප්පාඩු ගණනය කර ඇත.

සැ.යු. - තෘතිය මට්ටමේ තනතුරු වලට සහ ද්විතික මට්ටමේ තනතුරු වලට 2019.01.01, 2019.07.01,2020.01.01 සහ 2020.02.08 දිනට එක් එක් තනතුරේ අනුමත සංඛ්‍යාව නොසලකා දරන්නාට පුද්ගලික වන සේ උසස්වීම් ලබා දි ඇත. එබැවින් ශ්‍රී ලංකා පොලීසියේ සියළුම තනතුරු වල අනුමත සංඛ්‍යාව 85603 ක් වන හෙයින් අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි අවසන් පුරප්පාඩු 7103 ක සංඛ්‍යාවට පමණක් නව බඳවා ගැනීම් ලෙස සිදුකළ යුතුවේ.

**මූලාශ්‍රය - පොලිස් මානව සම්පත් කළමණාකරණ කොට්ඨාසය**

| මට්ටම් අනුව - සහායක සේවයේ සේවක සංඛ්‍යාව **2020.12.31** දිනට | | | | |
|---|---|---|---|---|
| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 97 | 7 | 90 | - |
| තෘතියික මට්ටම | 524 | 258 | 266 | - |
| ද්විතික මට්ටම | 4634 | 1067 | 3567 | - |
| ප්‍රාථමික මට්ටම | - | - | - | - |
| එකතුව | **5255** | **1332** | **3923** | - |

**මූලාශ්‍රය - පොලිස් මානව සම්පත් කළමණාකරණ කොට්ඨාසය**

**මට්ටම් අනුව - විශේෂ කාර්ය බලකායේ සේවක සංඛ්‍යාව 2020.12.31 දිනට**

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | දරන්නාට පුද්ගලික වන සේ | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 68 | 52 | - | **16** | - |
| තෘතියික මට්ටම | 346 | 337 | 137 | **09** | **137** |
| ද්විතික මට්ටම | 10329 | 8095 | 58 | **2234** | **58** |
| ප්‍රාථමික මට්ටම | - | - | - | - | - |
| එකතුව | **10743** | **8484** | **195** | **2259** | **195** |
| | **10743** | **8679** | | **2064** | - |

මූලාශ්‍රය - පොලිස් මානව සම්පත් කළමණාකරණ කොට්ඨාසය

## 6.2. ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය.

ශ්‍රී ලංකා පොලිස් සේවයේ මානව සම්පත් අතිරික්තයක් නොපවතින අතර, එහි හිඟයක් පවතින බැවින්, මානව සම්පත් හිඟය කාර්ය සාධනයට පහත ආකාරයට බලපෑම් සිදු කරනු ලබයි.

i. එක් එක් විෂය පථයට අදාල රාජකාරි සඳහා යෙදවීමට ප්‍රමාණවත් නිලධරයන් පිරිසක් නොමැති බැවින්, එක් නිලධරයෙකුගෙන් සේවයේ අවශ්‍යතාවය මත බහුවිධ රාජකාරි ඉටු කර ගැනීමට සිදුවීම.

ii. එක් එක් අංශයන්හි රාජකාරි වලට අදාල පාඨමාලාවන් හදාරා සිටින විවිධ දක්ෂතාවයන් ඇති නිලධරයන් සිටියද, ඔවුන් වෙත වෙනත් අංශයන්ට අදාල අධික රාජකාරි ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීම තුළින් ඇති වන මානසික පීඩනය මත ඔවුන්ගෙන් වඩාත් ඵලදායි රාජකාරියක් ඉටු කරවා ගැනීමට නොහැකි වීම.

iii. මානසික පීඩනයෙන් යුත් එම නිලධරයන්ගෙන් සමාජයට ගම්‍ය වන පණිවුඩය මඟින් නවක නිලධරයන් බඳවා ගැනීමේදී පොලිස් සේවයට එක් වන ප්‍රමාණය අඩුවීම හා ඒ සඳහා මැළිකමක් දැක්වීමේ ඉඩකඩ පැවතීම.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

**3 පොලිස් විදුහල මගින් සිදු කරන ලද පුහුණු වැඩ සටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (මාස) | සමස්ථ ආයෝජනය (රු. ,00) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම. |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ආධුනික පොලිස් කොස්තාපල් මූලික පුහුණු පාඨමාලා | 3505 | මාස 11 | 199,065,355.00 | - | දේශීය | මූලික පුහුණුව |
| ධාරිතා සංවර්ධන පාඨමාලා | 71 | මාස 14 | 800000.00 | - | දේශීය | වෘත්තීය දැනුම හා ආකල්ප වැඩිදියුණු කිරීම |
| තනතුරට හැඩගැන්වීමේ පාඨමාලා | -- | -- | -- | - | දේශීය | වෘත්තීය දැනුම හා ආකල්ප වැඩිදියුණු කිරීම |
| ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා | 160 | මාස 04 | 374000.00 | - | දේශීය | භාෂා හැකියාව වර්ධනය වීම. |
| රිය පුහුණු පාඨමාලා | -- | -- | -- | - | දේශීය | වාහන නඩත්තුව/ කාර්මික දැනුම හා රිය පැදවීම් පුහුණුව හා හැකියාව. |
| ද්‍රවිඩ භාෂා පුහුණු පාඨමාලා | -- | -- | -- | - | දේශීය | භාෂා හැකියාව වර්ධනය වීම |
| වන සටන් පුහුණු පාඨමාලා | -- | -- | -- | - | දේශීය | මානසික හා කායික අභියෝග වලට මුහුණ දීමේ ආත්ම ශක්තිය දියුණු වීම. |
| අවි පරිහරණ පාඨමාලා | -- | -- | -- | - | දේශීය | මානසික හා කායික අභියෝග වලට මුහුණ දීමේ ආත්ම ශක්තිය දියුණු කිරීම. |
| සොකෝ පාඨමාලා | 28 | මාස 05 | 700000.00 | - | දේශීය | විද්‍යාත්මකව අපරාධ ස්ථාන පරීක්ෂා |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | කිරීමේ හැකියාව ඇති නිලධාරීන් ක්ෂේත්‍රයට ලබා දිම |
| ආධුනික ස.පො.අ. පාඨමාලා | -- | -- | -- | - | දේශීය | වෘත්තීය දැනුම හා ආකල්ප වැඩිදියුණු වීම |
| ආධුනික උ.පො.ප. පුහුණු පාඨමාලා | 255 | මාස 15 | 143,118,230.00 | - | දේශීය | වෘත්තීය දැනුම හා ආකල්ප වැඩිදියුණු වීම |
| ශිෂ්‍යභට උපදේශක පාඨමාලා | -- | -- | -- | - | දේශීය | විනය ගරුක සිසු පරපුරක් බිහි වීම. |
| මහ සැරයන් වරුන්ගේ පාඨමාලා | 65 | මාස 03 | 7887965.00 | - | දේශීය | වෘත්තීය දැනුම හා ආකල්ප වැඩිදියුණු වීම |
| සියලු වැඩසටහන් සඳහා සමස්ථ ආයෝජනය | | | 351,945,550.00 | | | |

**මූලාශ්‍රය - පොලිස් විද්‍යාලය කළුතර**

## 4 කටාන පොලිස් අභ්‍යාස ආයතනය මගින් සිදු කරන ලද පුහුණු වැඩ සටහන්

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (මාස) | සමස්ථ ආයෝජනය (රු. ,00) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම. |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඩිප්ලෝමා පාඨමාල | 306 | මාස 06 සිට උපරිම වසරක් දක්වා | 1,060,009 | | දේශීය | නවීන විෂයානු බද්ධ දැනුම ලැබීම. |
| පුහුණු පාඨමාලා(සහතිකපත් පාඨමාලා) | 8232 | සති 01 සිට උපරිමය සති 05 ක් දක්වා | 6,116,697 | | දේශීය | නවීන විෂයානු බද්ධ දැනුම ලබාදීම |
| බාහිර ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් සිදු කරන ලද භාෂා හා වෙනත් පුහුණු පාඨමාලා | 186 | පැය 250 ක කාලයක් | 321135 | | දේශීය | නවීන විෂයානු බද්ධ දැනුම ලැබීම. |

**මූලාශ්‍රය - ජාතික පොලිස් අභ්‍යාස ආයතනය**

**5 සේවාස්ථ පුහුණු කොට්ඨාසය මගින් සිදු කරන ලද පුහුණු වැඩ සටහන්**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව (මාස) | සමස්ථ ආයෝජනය (රු. ,00) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම. |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඩිප්ලෝමා පාඨමාල | **609** | **මාස 06 සිට වසරක කාලයක්** | **1060009.00** | **--** | දේශීය | නවීන විෂයානු බද්ධ දැනුම ලැබීම. |
| පුහුණු පාඨමාලා(සහතිකපත් පාඨමාලා) | **7801** | **සති 01 සිට සති 06 දක්වා** | **4878711.00** | **--** | දේශීය | නවීන විෂයානු බද්ධ දැනුම ලැබීම. |
| පරිගණක පුහුණු පාඨමාලා | **431** | **සති 16 යි.** | **1237986.00** | **--** | දේශීය | නවීන විෂයානු බද්ධ දැනුම ලැබීම. |

**මූලාශ්‍රය - පොලිස් සේවස්ථ පුහුණු**

**❖ ආයතනයේ කාර්ය සාධනය සඳහා පුහුණු වැඩසටහන් වල දායකත්වය.**

ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය භාරය සාර්ථකව ඉටු කිරීම තුළින් එහි කාර්ය සාධනය ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම නිලධරයන්ට ලබාදීම පුහුණු වැඩසටහන් මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව 88000 කට අධික මානව සම්පත සඳහා විධිමත් පුහුණුවක් ශ්‍රී ලංකා පොලීසිය සතු පොලිස් විද්‍යාල, පොලිස් අභ්‍යාස ආයතන සහ සේවස්ථ පුහුණු ඒකක මගින් ලබාදෙනු ලබන අතර නව තාක්ෂණික දැනුම, භාෂා දැනුම මෙන්ම නීතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් අපරාධ මැඩලීම සහ සමාජ සුරක්ෂිත භාවය ගොඩනැගීමට මෙම පුහුණු වැඩ සටහන් මගින් ප්‍රභල දායකත්වයක් සපයනු ලබයි.

එමෙන්ම නිරවුල්ව රාජකාරී ඉටුකිරිම සඳහා අවශ්‍ය මානසික මට්ටම වර්ධනය කිරීම සඳහා අදාලවන පාඨමාලා ද පුහුණු වැඩ සටහන් වලට ඇතුළත් වේ. ඊට අමතරව සමාජ විද්‍යාත්මක දැනුම ලබාදිම තුළින් ද සමාජය පිළිබඳව නිලධරයන්ගේ දැනුම සහ ආකල්ප ඉහළ නැංවීම ද ආයතනයේ කාර්ය සාධනය සඳහා ඉවහල් වේ.

# පරිච්ඡේදය 07
# අනුකූලතා වාර්තාව

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | අනුකූල වේ | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල වේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | - | - |
| 1.6 | වෙනත් | අනුකූල වේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA 1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | කොට්ඨාස කාර්යාල වලින් පරීක්ෂා කොට පිළිතුරු ලබාදීමේ ප්‍රමාදයක් ඇත. | සිහි කැඳවීම් කරමින් නියමිත දිනට පිළිතුරු සැපයීමට උනන්දු කරවීම. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇත. | - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිරිපත් කිරීම | | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයොජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට මහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනිමේ පනතේ 08 වන මා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්‍ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම | අනුකූල වේ | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | අනුකූල වේ | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන්කර තිබීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

**මූලාශ්‍රය - ප්‍රධාන අභ්‍යන්තර විගණක පොලිස් මූලස්ථානය**

# කාර්ය සාධන වාර්තාව
# 2020

## ශ්‍රී ලංකා පොලීසිය

# 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# ශ්‍රී ලංකා පොලීසිය
# වැය ශීර්ෂ අංකය :- 225

**අන්තර්ගතය**


පරිච්ඡේදය - 01 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය - 02 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය - 03 වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය - 04 කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය - 05 තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය - 06 මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය - 07 අනුකූලතා වාර්තාව

# ශ්‍රී ලංකා පොලීසිය
# இலங்கை பொலிஸ்
# Sri Lanka Police

## කාර්යසාධන වාර්තාව
## செயலாற்று அறிக்கை
## Performance Report

## 2020